# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1979 අංක 58 දරන
## ගොවිජන සේවා පනත

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 සැප්තැම්බර් 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: රු. 2.85 යි.    තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 64/77.

කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කිරීම පිණිසත්; අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම පිණිසත්; කෘෂිකාර්මික බෝග සහ පශු සම්පත්වලින් නිසි ප්‍රයෝජන ගැනීමෙන් හා ඒවා නිසි පරිදි පාලනය කිරීමෙන් කුඹුරුවලින් සහ වෙනත් කෘෂිකාර්මික ඉඩම්වලින් උපරිම පලදා වර්ධනය ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; ගොවිජන සේවා කාරක සභා පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; ගොවිජන සේවා කොමසාරිස්වරයා විසින් කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ අඳ සහ වෙනත් ආරාවුල් විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; කොමසාරිස්වරයා වෙත ඇතැම් බලතල පැවරීම සහ කාර්ය නියම කිරීම පිණිසත්; වගා නිලධරයන් පත්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත ඉවත් කිරීමට විධිවිධාන සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවියෝ

2. (1) යම් කුඹුරු ප්‍රමාණයක් යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ බදු ගත් යම් තැනැත්තෙක් ඒ කුඹුරු ප්‍රමාණයෙහි ගොවියා වී සිටී ද ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වේ නම් මේ පනතෙහි විධිවිධානවලට යටත්ව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙහි අඳ ගොවියා විය යුතු ය. කුඹුරක් බදු ගත් තැනැත්තකු එහි අඳ ගොවියා ලෙස සැලකිය යුතු අවස්ථා.

(2) යම් කුඹුරු ප්‍රමාණයක් යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ බදු ගත් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් හවුලේ හෝ තට්ටු මාරුවට ඒ කුඹුරු ප්‍රමාණයෙහි ගොවියා ව සිටින විට ඒ එක් එක් තැනැත්තා ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්, ඒ කුඹුරු ප්‍රමාණයෙහි තමා ගොවියකු වී සිටින කන්නය හෝ කන්න සඳහා එහි අඳ ගොවියකු විය යුතු ය.

2—ඒ 42194 – 15,200 (79/06)

ඉඩම් හිමියා විස්තර සැපයිය යුතු බව.

3. (1) යම් කුඹුරු ප්‍රමාණයක් අයත් සෑම ඉඩම් හිමියකු විසින් ම එම කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් අඳ ගොවියකු සිටින්නේ නම්, මේ පනත ආරම්භවීමේ දින සිට මාස හයක් ඇතුළත දී, නියමිත ආකාරයට පහත සඳහන් විස්තර කොමසාරිස්වරයාට සැපයිය යුතු ය:—

(අ) ඉඩම් හිමියාගේ නම;

(ආ) අඳ ගොවියාගේ නම;

(ඇ) අඳ ගොවියා විසින් වගා කරනු ලැබූ කුඹුරු ප්‍රමාණය; සහ

(ඈ) නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විස්තර සැපයීමේ කාර්ය සඳහා ඉඩම් හිමියා විසින්, තත් කාලයේ බලපවත්නා කෘෂිකාර්මික ඉඩම් ලේඛනය බැලිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් විස්තරවල යම් වෙනසක් ඇති වන අවස්ථාවක, එම වෙනස ඇති වී සති හයක් ඇතුළත ඉඩම් හිමියා විසින් ඒ බව කොමසාරිස්වරයාට දැනුම් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ නියමයන් පිළිපැදීම පැහැර හරින යම් ඉඩම් හිමියකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

උපරිම කුඹුරු ප්‍රමාණය තීරණය කෙරෙන නියමය.

4. (1) අඳ ගොවියකු විසින් වගා කළ හැකි උපරිම කුඹුරු ප්‍රමාණය අක්කර පහක් විය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින්, එකී නියමය අදාළ වන යම් දිස්ත්‍රික්කයක් තුළ අඳ ගොවියකු විසින් වගා කළ හැකි කුඹුරු ප්‍රමාණය (1) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව තීරණය කළ හැකි ය:

එසේ වුව ද යම් අඳ ගොවියකු අක්කර පහකට නොඅඩු කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමි ගොවියකු බවට නිසි පරීක්ෂණයකින් පසුව කොමසාරිස්වරයා සෑහීමට පත්වූ අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ අඳ ගොවියකු වශයෙන් තමාට ඇති අයිතිවාසිකම්වලට ඒ අඳ ගොවියාට හිමිකම් නොලැබිය යුතු බව කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කළ හැකි අතර (3) වන, (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධාන ඒ අනුව ඒ අඳ ගොවියාට අදාළ විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයකින් තීරණය කරන ලද කුඹුරු ප්‍රමාණයට වැඩිමනත් කුඹුරු ප්‍රමාණයක් අඳ ගොවියා විසින් බුත්ති විඳිමින් සිටියි නම්, වගා කිරීමට තමාට හිමි කම තිබෙන කුඹුරු ප්‍රමාණය කොමසාරිස්වරයාගේ අනුමතයට යටත් ව, තෝරා ගැනීමට ඔහුට හිමිකම තිබිය යුතු අතර, ඉතිරි කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් වන ලෙස කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ විට, ඔහු එම ඉතිරි කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් විය යුතු ය.

(4) අඳ ගොවියකු (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත්, (2) වන උපවගන් තිය යටතේ වූ නියමයකින් සඳහන් කරනු ලැබූ ප්‍රමාණයට වඩා

වැඩිමනත් කුඹුරු ප්‍රමාණයෙන් ඔහු අස් කරනු ලැබිය යුතු අතර, එවැනි අස් කිරීමකට 6 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) අඳ ගොවියා විසින් එම ඉඩම් ප්‍රමාණයෙන් ඉවත්ව යාමෙන් පසු, කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව—

(අ) ඉඩම් හිමියාට නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසි මත එම ප්‍රමාණය ගොවිතැන් කිරීමට ඉඩම් හිමියාට හිමිකම තිබිය යුතු ය ; නැතහොත්

(ආ) ඉඩම් හිමියා විසින් එම ප්‍රමාණය සඳහා අඳ ගොවියන් එක් කෙනකු හෝ ඊට වැඩි දෙනකු නියම කරනු ලැබිය හැකි යම් කාලයක් තුළ පත් කරනු ලැබිය යුතු ය.

(6) නියමිත කාලය ඇතුළත දී (5) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කටයුතු කිරීම ඉඩම් හිමියා පැහැර හරින අවස්ථාවක, එම කුඹුරු ප්‍රමාණය වගා කිරීමට සුදුසු තැනැත්තකු පත් කිරීමට කොමසාරිස්වරයාට හිමිකම තිබිය යුතු ය.

5. (1) යම් කුඹුරු ප්‍රමාණයක් ගොවිතැන් කරන අඳ ගොවියකුට මේ පනතේ විධිවිධාන අනුව එම කුඹුරු ප්‍රමාණයට ඇතුළුවීමේ හා බුක්තිවිඳීමේ අයිතිවාසිකම තිබිය යුතු ය. එම කුඹුරු ප්‍රමාණය අඳ ගොවියාට බද්දට දී ඇති යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක කුමක් සඳහන් වුව ද, ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් නොකළ යුතු ය. තවද අඳ ගොවියා ඒ කුඹුරු ප්‍රමාණය බුක්තියට ගෙන වැඩ කිරීමේ දී, කිසිම තැනැත්තකු විසින් එයට බාධා නොකළ යුතු අතර ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනත යටතේ ඉඩම් හිමියාට ගෙවීමට නියමිත බද්දට වැඩි කිසිම බද්දක් ඉඩම් හිමියා විසින් අඳ ගොවියාගෙන් ඉල්ලීම හෝ භාර ගැනීම නොකළ යුතු ය.

අඳ ගොවියන්ගේ අයිතිවාසිකම් කුඹුරුවලින් අස් කරනු ලැබූ ඇතැම් අඳ ගොවියන් සම්බන්ධ විධිවිධාන හා කුඹුරුවල අඳ ගොවියන් අස් කිරීම පිළිබඳ සීමාව.

(2) වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත යටතේ යම් තැනැත්තකු විසින් මිළට ගත් හෝ බෙදීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් යටතේ සම අයිතිකරුවකුට වෙන් කර දෙන ලද, යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා, අවස්ථාවෝචිත විය හැකි පරිදි, ඒ ගැනුම්කරුගේ හෝ ඒ සම අයිතිකරුගේ අඳ ගොවියා ලෙස සැලකිය යුතු අතර මේ පනතේ විධිවිධාන ඒ පරිද්දෙන් ම අදාළ විය යුතු ය.

(3) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින්, කොමසාරිස්වරයා වෙත, තමන් ඒ ප්‍රමාණයෙන් අස් කරනු ලැබූ ඇතැයි නිවේදනය කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා අස් කරනු ලැබී ද නොලැබී ද යන ප්‍රශ්නය නිරාකරණය කිරීමේ කාර්යය සඳහා ඒ කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්විය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් නිවේදනය, එසේ අස් කළ දිනයේ සිට අවුරුද්දක් ඇතුළත කළ යුතු ය :

එසේ වුව ද, මේ පනත ආරම්භවීමේ දිනට පෙරාතුව වූ වර්ෂ දෙක ඇතුළත යම් අවස්ථාවක එම අඳ ගොවියා අස් කර ඇති විටෙක, මෙම පනත ආරම්භවීමේ දින සිට අවුරුදු දෙකක් ඇතුළත එම නිවේදනය කළ යුතු ය.

(5) අඳ ගොවියා අස් කරනු ලැබ ඇති බව කොමසාරිස්වරයා සෑහිමට පත් වන සේ ඒ පරීක්ෂණයේ දී ඔප්පු කරනු ලැබුව හොත්, විරුද්ධ තත්ත්වයක් ඇති බව ඔප්පු කරනු ලැබූ විටක හැර, ඒ අස්කිරීම කරන ලද්දේ ඉඩම් හිමියා විසින් හෝ ඔහුගේ වුවමනාව පරිදි බව පූර්ව නිගමනය කළ යුතු ය.

(6) ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ අස් කරනු ලැබූ තැනැත්තාට පෞද්ගලික ව හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් ඒ පරීක්ෂණයේ දී කරුණු දක්වා සිටීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය. ඒ පරීක්ෂණයෙන් පසුව කොමසාරිස්වරයාගේ තීරණය ඉඩම් හිමියා වෙත හා අස් කරනු ලැබූ තැනැත්තා වෙත ලියවිල්ලකින් නිවේදනය කළ යුතු ය. ඒ තීරණයෙන් ඉඩම් හිමියා හෝ අස් කරනු ලැබූ තැනැත්තා අතෘප්තියට පත් වූයේ නම්, තමන් වෙත ඒ නිවේදනය ලැබීමෙන් පසු තිස් දවසක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව ඔහු විසින් අනෙක් තැනැත්තා වගඋත්තර කරු ලෙස සඳහන් කොට ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් නීති ප්‍රශ්නයක් මත අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය. ඒ සඳහා ඉඩ දෙනු ලැබූ කාලය ඇතුළත කොමසාරිස්වරයාගේ තීරණයට විරුද්ධව අභියාචනයක් කරනු නොලැබූ අවස්ථාවක දී, එම තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර, එය කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(7) (3) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ පරීක්ෂණයක දී—

(අ) අස් කිරීමක් තහවුරු වී ඇති බව කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලදුව, ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් කිරීමට දී ඇති කාලසීමාව ඇතුළත අභියාචනයක් කර නොමැති අවස්ථාවක, නැතහොත් අස් කිරීමක් තහවුරු වී ඇති බවට වූ කොමසාරිස්වරයාගේ තීරණය අභියාචනාධිකරණය විසින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක ; හෝ

(ආ) අස් කිරීමක් තහවුරු වී නොමැති බව කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලදුව කොමසාරිස්වරයාගේ තීරණය අභියාචනාධිකරණය විසින් වෙනස් කොට, අස් කිරීමක් තහවුරු වී ඇතැයි තීරණය කළ අවස්ථාවක—

(i) අස් කරනු ලැබූ තැනැත්තාට ඒ කුඹුරු ප්‍රමාණයට ඇතුළුවී බුක්තිවිඳීමේ අයිතිවාසිකම ආපසු ලබා දිය යුතු ය ; තව ද

(ii) කොමසාරිස්වරයා විසින් කෙරෙන ලිඛිත නියමයක නිශ්චිතව සඳහන් දිනයක හෝ ඉන් පෙර ඒ කුඹුරු ප්‍රමාණය බුක්තියට ගෙන සිටින සෑම තැනැත්තකුම එයින් ඉවත් විය යුතු යයි ඒ නියමයෙන් නියම කළ යුතු ය. ඒ තැනැත්තා විසින් නියමය පිළිපැදීම පැහැර හැරියහොත් 6 වන වගන්තියේ විධිවිධාන අනුව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කළ යුතු අතර, මේ ඡේදය යටතේ නිකුත් කරන ලද නියමයකට විෂය වූ තැනැත්තකු

ඒ නියමයේ නිශ්චිත දිනයෙන් පසු ඒ කුඹුරු ප්‍රමාණය බුත්තියට ගෙන සිටීම කරගෙන යන එක් එක් දවස සඳහා ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින් තම දැනුම, කැමැත්ත හෝ ගුප්තානුකූලතාව යන මෙයින් තොරව ඒ තැනැත්තා අස් කරනු ලැබූ බව කොමසාරිස්වරයා සෑහීමට පත් කරනු ලැබූ විටක හැර, ඒ කුඹුරු හිමියා විසින් (i) වන අනුඡේදයේ සඳහන් තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනුව, අලාභ ගෙවිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අලාභ වශයෙන් ගෙවිය යුතු යයි කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමියකුට නියම කරනු ලැබූ යම් මුදලක් එය ඉල්ලා සිටි දිනයෙන් පසු දින දහහතරක් ඇතුළත ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ කුඹුරු ප්‍රමාණය පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය දරන මහේස්ත්‍රාත් අධිකරණය වෙත අස් කරනු ලැබූ තැනැත්තා විසින් ඉල්ලීමක් කරනු ලැබීමෙන්, ඒ මුදල එම අධිකරණය විසින් සිය සාමාන්‍ය අධිකරණ බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහි දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වැඩි වුව ද ඒ අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක ආකාරයෙන් අය කර ගත හැකි ය.

(9) (මින් මතු මේ උපවගන්තියේ "බදු දෙන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු (මින් මතු මේ උපවගන්තියේ "බදු ගන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට කිසියම් කුඹුරු ප්‍රමාණයක් බදු දුන් විට, ඒ බදුගන්නා එය වගා කරන්නා නොවීමේ හේතුවෙන් එහි අඳ ගොවියා නොවන කල්හි, ඔහු ඒ කුඹුරු ප්‍රමාණය (මින් මතු මේ උපවගන්තියේ "අතුරු අඳ ගොවියා" ලෙස සඳහන් කරනු ලබන) අන් තැනැත්තකුට බදු දී ඒ අතුරු අඳ ගොවියා එහි වගා කරන්නා වීමේ හේතුවෙන් එහි අඳ ගොවියා බවට පත් වුවහොත් බදු දෙන්නා විසින් බදු ගන්නාට දුන් බද්ද කෙළවර වීම, අතුරු අඳ ගොවියාට එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් ඇති අයිතිවාසිකම් කෙරෙහි කිසිම අයුරකින් බල නොපෑ යුතු ය:

එසේ වුව ද බදු ගන්නා විසින්,—

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබාගත්තේ නම්; හෝ

(ආ) ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටියේ යම් ගොවිජන සේවා කාරක සභාවක බල ප්‍රදේශයක ද ඒ ගොවිජන සේවා කාරක සභාවට ඉන්පසු දැනුම් දෙන්නේ නම්,

මිස අතුරු අඳ ගොවියකුට ඒ කුඹුරු ප්‍රමාණය බදු නොදිය යුතු ය:

එසේම තවදුරටත් යම් කුඹුරු ප්‍රමාණයක අයිතිකරුගේ කැමැත්ත ලියවිල්ලකින් නොලබා බදු ගන්නකු විසින් අතුරු අඳ ගොවියකුට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය බදු දෙනු ලැබූ අවස්ථාවක 4 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන අනුව ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අයිතිකරුට හිමිකම තිබිය යුතු ය.

(10) යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව ඉඩම් හිමියා සතු අයිතිවාසිකම, හිමිකම හා සම්බන්ධතාව තෑගි කිරීම, අන්තිම කැමති පත්‍රයක් මගින් වෙන් කර දීම, වෙන් කර දීම හෝ බැහැර කිරීම, ප්‍රවේණි නීතිය යටතේ උරුමවීම නැතහොත් (ස්වේච්ඡාවෙන් හෝ අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීම අනුව කෙරෙන) විකිණීම ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා සතු අයිතිවාසිකම්වලට කිසි ලෙස කිසි බල නොපාන්නේ ය.

(11) යම් කුඹුරු ප්‍රමාණයකට ඇතුළුවී බුත්ති විඳීම පිළිබඳව අඳ ගොවියා සතු අයිතිවාසිකම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් පරිදි තහනම් කිරීම, අල්ලා ගැනීම හෝ විකිණීම නොකළ යුතු ය.

(12) මේ පනතින් හෝ මේ පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකුට පැවරුණු යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ක්‍රියාවෙහි යෙදීමෙන් වැළකී සිටීමට ඔහු පෙළඹවීමට, ඔහුට බල කිරීම හෝ ඔහු ඊට කැමති කරවා ගැනීම පිණිස යම් තැනැත්තකු ඒ අඳ ගොවියා කෙරෙහි හෝ ඔහුට විරුද්ධව, නියම වශයෙන් හෝ අනියම් වශයෙන්, යම් බලහත්කාරකමක්, සැහැසිකමක් හෝ අවහිරයක් කළහොත් හෝ කරන බවට තර්ජනය කළහොත් හෝ යම් හානියක්, අලාභයක් හෝ පාඩුවක් සිදු කළහොත් හෝ කරන බවට තර්ජනය කළහොත් ඒ අඳ ගොවියා විසින් ඒ කුඹුරු ප්‍රමාණයට ඇතුළුවීමෙහි හා බුත්ති විඳීමෙහි ලා ඔහුට ඒ තැනැත්තා බාධා පමුණුවන ලෙස සැලකිය යුතු ය.

(13) යම් තැනැත්තකු මේ වගන්තියේ විධිවිධාන කඩකරන්නේ නම් ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

අස්කිරීමේ කාර්ය පටිපාටිය.

6. (1) යම් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් හැර යන ලෙස කොමසාරිස්වරයා විසින් මේ පනත යටතේ නියමයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඒ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැරි අවස්ථාවක,—

(අ) ඒ නියමය අදාළවන ඉඩම් ප්‍රමාණය විස්තර කරමින්, ඒ නියමයෙහි ස්වභාවය සහ එය නිකුත් කරනු ලැබූ තැනැත්තා කවරකු ද යන වග දක්වෙන්නා වූ;

(ආ) එම ඉඩම් ප්‍රමාණය හැරයාමට නියෝග කරනු ලැබ, එය පැහැර හැර ඇති තැනැත්තා සඳහන් කෙරෙන්නා වූ; සහ

(ඇ) ඒ තැනැත්තා සහ ඒ ඉඩම් ප්‍රමාණයෙහි රැඳී සිටින අන් සියලුම තැනැත්තන් ඒ ඉඩම් ප්‍රමාණයෙන් අස් කිරීම පිණිස නියමයක් නිකුත් කරන ලෙස ඉල්ලම් කෙරෙන්නා වූ ද, ඒ ඉඩම් ප්‍රමාණයේ සන්තකය භාර දිය යුතු තැනැත්තාගේ නම සඳහන් කෙරෙන්නා වූ ද

ලිඛිත වාර්තාවක් කොමසාරිස්වරයා විසින් නැතහොත් ඒ සඳහා කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු විසින්, ඒ ඉඩම් ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී ඒ වාර්තාවෙහි නිශ්චිත තැනැත්තා සහ ඒ නියමයෙහි නිශ්චිත ඉඩම් ප්‍රමාණය බුක්තියට ගෙන සිටින සෙසු සියලුම තැනැත්තන් අප්‍රමාදව අස්කොට ඒ ප්‍රමාණයේ සන්තකය භාර දිය යුතු තැනැත්තා ලෙස ඒ වාර්තාවේ සඳහන් තැනැත්තා වෙත ඒ ප්‍රමාණයේ සන්තකය භාර දෙන ලෙස ඒ අධිකරණය විසින් පිස්කල්ට හෝ සාම නිලධර යාට විධාන කළ යුතු ය.

(3) අස්කිරීමේ ආඥාව ක්‍රියාවෙහි යෙදවීමට භාර දෙනු ලැබූ පිස්කල් විසින් හෝ සාම නිලධරයා විසින් හෝ ඒ ආඥාව නිකුත් කළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි නියමයන් අනුව ක්‍රියා කළ යුතු අතර තමා ඒ ආඥාව ක්‍රියාවෙහි යෙදූ ආකාරය පිළිබඳව යථා පරිදි අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(4) අස්කිරීමේ නියමය ක්‍රියාවෙහි යෙදවීමේ දී පිස්කල් හෝ සාම නිලධරයා විසින් නැතහොත් ඔවුන් අතුරින් කවරකු විසින් වුව ද බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ ආඥාව අදාළ වන කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයට ඇතුළුවීම සඳහා ද ආඥාව නිකුත් කළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි නියමයන් අනුව ආඥාවෙන් බැඳී සිටින යම් තැනැත්තකු අස් කිරීම සඳහා ද ඒ ප්‍රමාණයේ සන්තකය භාරදීම සඳහා ද අවශ්‍ය විය හැකි බලය යෙදිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය යටතේ පිස්කල් විසින් යම් කුඹුරු ප්‍රමාණයක් සන්තකයෙහි තබන ලද අඳ ගොවියකු නීති විරෝධී ලෙස අසන්තක කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරද කට වරදකරු විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා වරදකරු කරනු ලැබූ විට, එම ඉඩම් ප්‍රමාණයෙන් නීති විරෝධී ලෙස අසන් තක කරනු ලැබූ අඳ ගොවියාට, එම ඉඩම් ප්‍රමාණය බුක්ති විඳින යම් තැනැත්තකු අස් කිරීමෙන්, එම ඉඩම් ප්‍රමාණයේ සන්තකය භාර දෙන ලෙස මහේස්ත්‍රාත්වරයා පිස්කල්ට විධාන කරනු ලැබිය යුතු ය.

අඳ ගොවියාගේ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයකු නම් කිරීම.

7. (1) මෙම පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව, ඒ කුඹුරු ප්‍රමාණය සඳහා යම් අඳ ගොවියකු සමග හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරන අඳ ගොවියකු හැර සෙසු අඳ ගොවියකු සතු අයිතිවාසිකම්වලට තමාගේ මරණින් පසු අනුප්‍රාප්තිකයකු ලෙස ඔහුගේ පවුලේ සාමාජිකයකු නම් කිරීම ඒ කුඹුරු ප්‍රමාණයෙහි අඳ ගොවියා විසින් කළ හැකි ය.

(2) තම අයිතිවාසිකම්වලට යම් අනුප්‍රාප්තිකයකු නම් කිරීමක් කළ අඳ ගොවියා කිසියම් විටක ඒ නම් කිරීම අවලංගු කර ඒ සඳහා අලුතින් අනුප්‍රාප්තිකයකු නම් කළ හැකි ය.

(3) අඳ ගොවියකු විසින්, තමාගේ අනුප්‍රාප්තිකයකු නම් කිරීම සහ එබඳු නම් කිරීමක් අවලංගු කිරීම දිසාපතිවරයකු, ප්‍රාදේශීය උප දිසාපතිවරයකු, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයකු, නොතාරිස්වරයකු හෝ සාම විනිශ්චයකාරවරයකු හමුවේ නියමිත ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකක් සහිතව සාක්ෂි සමග ලියා අත්සන් කළ ලියවිල්ල කින් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් ලියා අත්සන් කිරීමේ දී මුද්දර ගාස්තුවක් ගැනීම හෝ අය කිරීම නොකළ යුතු ය.

(5) (3) වන උපවගන්තියේ නියමිත ලේඛනයක්, ලේඛන ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ කාර්ය සඳහා ඉඩම් පිළිබඳ වූ ලේඛන යක් යයි නො සැලකිය යුතු අතර, ඒ ලේඛනය අත්සන් කළ යුත්තේ යම් තැනැත්තකු ඉදිරියේද, ඒ තැනැත්තාට ඒ ආඥා පනතේ II වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(6) (3) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් එහි සඳහන් කෙරෙන ඉඩම් ප්‍රමාණය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබුවහොත් මිස ද එසේ ලියාපදිංචි කරන තෙක් ද වලංගු නොවිය යුතු ය.

(7) මෙම පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව, අඳ ගොවියා සතු අයිතිවාසිකම්වලට යම් තැනැත්තකු අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන, (3) වන උපවගන්තියේ නියමිත ලේඛන යක් ලියාපදිංචි කිරීමෙන් පසු එම ලියාපදිංචි කළ ලේඛනයෙන් කැරුණු නම් කිරීම අවලංගු කරන ලේඛනයක් ලියාපදිංචි කිරීමේ මාර්ගයෙන් යථා පරිදි අවලංගු කරන තුරු, වෙන යම් තැනැත්තකු ඒ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන ඒ උප වගන්තියේ නියමිත ලේඛනයක් ලියාපදිංචි නො කළ යුතු ය. එකම ලේඛනයකින් ලියාපදිංචි කළ නම් කිරීමක් අවලංගු කර, ඒ වෙනුවට අනෙක් නම් කිරීමක් ද කළ හැකි ය. එසේ වූ කල්හි, අවලංගු කිරීම හා නම් කිරීම එක්ව දක්වෙන ලේඛනය ලියාපදිංචි කළ හැකි වන අතර නිසි පරිදි එය ලියාපදිංචි කළ පසුව, කලින් ලියාපදිංචි කළ නම් කිරීම අවලංගු කිරීම සහ අලුත් කෙනකු නම් කිරීම යන දෙයාකාරයට ම වලංගු විය යුතු ය.

(8) (3) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් ලියාපදිංචි කරන පිළිවෙළ ද, තැබිය යුතු රෙජිස්ටර ද එසේ ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු ද, නියම කෙරෙන නියෝග සෑදිය හැකි ය.

(9) (6) වන උපවගන්තියේ කාර්යය සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා තබන යම් ලේඛනයක් ඔහුගේ කාර්යාලයේ දී නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව පරීක්ෂා කිරීමට යම් කෙනකුට හිමිකම් තිබිය යුතු ය.

අනුප්‍රාප්තිකයකු නම් නොකළ විට හෝ තට්ටු මාරුවට වගා කරන විට අඳ ගොවියාගේ අයිතිවාසිකම් අන් අයට උරුම වීම.

8. (1) යම් කුඹුරු ප්‍රමාණයක් වෙන යම් අඳ ගොවියකු සමග හවුලේ හෝ තට්ටු මාරුවට ගොවිතැන් කරන අඳ ගොවියකු හැර, සෙසු අඳ ගොවියකු 7 වන වගන්තිය යටතේ අනුප්‍රාප්තිකයකු නම් නොකොට මිය ගිය විට හෝ එම වගන්තිය යටතේ ඔහු නම් කළ අනුප්‍රාප්තිකයා මිය ගිය විට, මේ පනත යටතේ එම කුඹුරු ප්‍රමාණය පිළිබඳව ඔහු සතු අයිතිවාසිකම් එම අඳ ගොවියාගේ ඇවෑමෙන් ජීවත්වන ඔහුගේ බිරිඳ වෙත ද, එවැන්නකු නැති විට, ඔහුගේ දරුවකුට ද, එම අඳ ගොවියාට දරුවන් එක් කෙනකුට වඩා වැඩියෙන් සිටිත් නම්, ඔවුන් අතුරෙන් වැඩිමලාට ද එබඳු අඳ ගොවියකුට දරුවන් නොමැති විට ඒ අඳ ගොවියාගේ දෙමව්පියකු, සහෝදරයකු හෝ සහෝදරියක වෙත උරුම විය යුතු ය. එහෙත් එසේ උරුම වීමට නම් එම මියගිය අඳ ගොවියාගේ අයිතිවාසිකම්වලට හිමිකම් ලබන අනුප්‍රාප්තිකයාගේ ප්‍රධාන රැකියාව ගොවිතැන විය යුතු අතර ඔහුගේ එකම ආදායම් මාර්ගය ඒ කුඹුරු ප්‍රමාණයෙන් සැලසී තිබිය යුතු ය.

(2) වෙන යම් අඳ ගොවියකු හෝ අඳ ගොවියන් සමග හවුලේ හෝ තට්ටු මාරුවට ගොවිතැන් කරන යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මියගිය විට, ඒ අඳ ගොවියා වශයෙන් ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් ඔහුගේ අයිතිවාසිකම් ඒ වෙන යම් අඳ ගොවියාට හෝ අඳ ගොවියන්ට උරුම විය යුතු ය.

අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුමවීම පිළිබඳ ආරාවුල් කොමසාරිස්වරයා විසින් තීරණය කළ යුතු බව.

9. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට, මේ පනත යටතේ ඒ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම විය යුතු තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව ආරාවුලක් ඇති වූ අවස්ථාවක, ඒ ආරාවුල බේරුම් කිරීම සඳහා ඒ ආරාවුලේ පාර්ශ්වකරුවන් විසින්, ආරාවුලට හේතු වූ ඉඩම් ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටියේ යම් කොමසාරිස්වරයකුගේ බල ප්‍රදේශය තුළ ද ඒ කොමසාරිස්වරයා වෙත එය යොමු කළ යුතු ය. ඒ ආරාවුල පිළිබඳ ව කොමසාරිස්වරයාගේ නිශ්චය කිරීම ආරාවුලේ පාර්ශ්වකරුවන් වෙත දැනුම් දිය යුතු ය.

(2) ඒ ආරාවුලේ පාර්ශ්වකරුවන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චයෙන් අතෘප්තියට පත් වූ අවස්ථාවක, ඒ නිශ්චය ඔවුන් වෙත දැනුම් දී දින තිහක් ඇතුළත ඔවුන්ට ඒ නිශ්චයට විරුද්ධව නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

දේපළ ආරක්ෂකයෝ.

10. (1) කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන විභාග කිරීමෙන් පසුව මේ පනත යටතේ අඳ ගොවියාගේ අයිතිවාසිකම් බාලවයස්කරුවකුට උරුම වී තිබෙන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, වෙන යම් නීතියක කුමක් සඳහන් වුවද, ඒ බාලවයස්කරුට මේ පනත යටතේ තම අයිතිවාසිකම් පාවිච්චි කිරීමට සහ යුතුකම් ඉටු කිරීමට හැකි කරවීමේ කාර්යය සඳහා ඒ කොමසාරිස්වරයා විසින් ඒ බාලවයස්කරුගේ දේපළ ආරක්ෂකයා වීමට සුදුසු වූ ද යෝග්‍ය වූ ද තැනැත්තකු පත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ දේපළ ආරක්ෂකයකු ඔහුගේ යුතුකම් ඉටු කිරීමට අපොහොසත් වී සිටින බවට හෝ බාලවයස්කරුගේ යහපතට විරුද්ධ හෝ හානිකර ලෙස ක්‍රියා

කිරීම හෝ හැසිරීම සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට හෝ තව දුරටත් ධුරය දැරීමට දේපළ ආරක්ෂකයා නුසුදුසු බවට හෝ වෙන යම් සැහෙන හේතුවක් නිසා හෝ විභාග කර බැලීමෙන් පසු කොම සාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, කොමසාරිස්වරයා විසින් ඒ දේපළ ආරක්ෂකයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ දේපළ ආරක්ෂකයකු තමා දේපළ ආරක්ෂකයකු වී සිටින්නේ යම් බාල වයස්කරුවකු සඳහා ද ඒ බාලවයස්කරුට අයිති කුඹුරු ප්‍රමාණය පිළිබඳව නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් පත් කරනු ලැබූ දේපළ ආරක්ෂකයකුගේ සියලුම අයිතිවාසිකම් ලැබ ඒවා ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සියලු බැඳීම්වලට ද ඔහු යටත් විය යුතු ය.

(4) බාලවයස්කරුවකුගේ දේපළ ආරක්ෂක වශයෙන් (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තකු ඒ බාලවයස් කරුගේ දේපළ ආරක්ෂක වශයෙන් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබූ විට සිය ධුරය දැරීම අවසන් කළ යුතු ය.

අඳගොවියකුගේ අයිතිවාසිකම් පැවරීම හෝ ආපසු දීම

**11.** (1) යම් කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමියා වෙත සහ ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන වගා නිලධරයා වෙත එසේ කිරීමට තමා අදහස් කරන බව ලියවිල්ලකින් දැන්වීමෙන් පසු ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා විසින්—

(අ) තමා ඒ කුඹුරු ප්‍රමාණය වෙන යම් අඳ ගොවියකු හෝ අඳ ගොවීන් සමග හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරතහොත් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ තමාගේ අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ඒ වෙන යම් අඳ ගොවීන්ගෙන් යම් කෙනකුට පැවරිය හැකි ය; තව ද

(ආ) තමා ඒ කුඹුරු ප්‍රමාණය වෙන යම් අඳ ගොවියකු හෝ අඳ ගොවීන් සමග හවුලේ හෝ තට්ටු මාරුවට වගා නොකරත හොත් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ තමාගේ අයිතිවාසිකම් ස්වකීය භාර්යාවට හෝ එවැන්නකු නොමැති විට, ඔහුගේ දරුවකුට ද, එම අඳ ගොවියාට දරුවන් එක් කෙනකුට වඩා වැඩියෙන් සිටිත් නම්, ඔවුන් අතුරෙන් වැඩිමලාට ද පැවරිය හැකි ය.

(2) කොමසාරිස්වරයා අවශ්‍ය යයි සලකනු ලබන විභාග පැවැත් වීමෙන් පසුව, ඔහු විසින් දෙනු ලබන ලිඛිත අනුමතය ඇතිව, සහ නියමයන් මත යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ ව තමාගේ අයිතිවාසිකම්, තම ඉඩම් හිමියා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු ද වේ නම්, ඒ ඉඩම් හිමියාට ආපසු දිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් අඳ ගොවියකු විසින් කරනු ලබන යම් පැවරී මක් හෝ ආපසු දීමක් අවලංගු සහ බලරහිත විය යුතු අතර, ඒ ඉඩම් ප්‍රමාණය බුත්ති විඳින තැනැත්තා 6 වන වගන්තියේ විධිවිධානවලට

අනුකූලව අස් කරනු ලැබීමට යටත් විය යුතු ය. තව ද, එවැනි අස් කිරීමක දී, 4 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කුමක් වුවද, යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා විසින් කරන ලද අනුප්‍රාප්තිකයකු නම් කිරීමක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, මේ වගන්තියේ ඉහත සඳහන් ගොවියාගේ අයිතිවාසිකම් පිළිබඳව මේ වගන්තිය යටතේ පැවරීමක් හෝ ආපසු දීමක්, ඒ නම් කිරීම යථා පරිදි අවලංගු කරනු ලැබුවේ නම් මිස හා එසේ කරන තුරු වලංගු නොවන්නේ ය.

අඳ ගොවියාගේ අයිතිය පැවරීමේ ප්‍රතිඵලය.

12. යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකුගේ අයිතිය ඔහු විසින් යම් තැනැත්තකුට පැවරූ කල්හි ඒ තැනැත්තා මේ පනතේ විධිවිධානවලට යටත්ව එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියකු බවට පත් වන්නේ ය.

අඳ ගොවියකුගේ අයිතිවාසිකම් උරුම වීමට අනුප්‍රාප්තිකයකු නොමැති අවස්ථා.

13. යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන්, මිය ගිය තැනැත්තාගේ අයිතිවාසිකම් මේ පනත යටතේ උරුම වීමට නාම යෝජිත අනුප්‍රාප්තිකයකු හෝ පවුලේ සාමාජිකයකු නොමැති අවස්ථාවක—

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු ද වේ නම්, තමන් ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියා වීමට කැමති බව ඒ අඳ ගොවියා මිය යාමෙන් මාස දෙකක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ලිඛිත දැන්වීමක් කිරීමෙන් පසු ඔහු විසින් එහි ඉඩම් හිමි ගොවියා වශයෙන් ඒ කුඹුරු ප්‍රමාණයට ඇතුළු වී එය බුත්ති විඳිය හැකි ය; නැතහොත්

(ආ) ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා, ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු නොවේ නම්, හෝ ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා සහ අයිතිකරු (අ) ඡේදයෙහි සඳහන් ලිඛිත දැන්වීම කිරීම සඳහා දෙන ලද කාලය තුළ එසේ කිරීම පැහැර හැරිය හොත්, කොමසාරිස්වරයා විසින් ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

මියගිය අඳ ගොවියකුගේ කුඹුරු ප්‍රමාණයේ අයිතිවාසිකම්වලට හිමිකම් නැති තැනැත්තකු ඊට ඇතුළුවී බුත්ති නොවිඳිය යුතු බව.

14. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය අවස්ථාවක මේ පනත යටතේ, එකී අඳ ගොවියාට ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳව ඇති අයිතිවාසිකම්වලට හිමිකම් නැති කිසිම තැනැත්තකු ඊට ඇතුළු වී එය බුත්ති විඳීම නො කළ යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් යම් කුඹුරු ප්‍රමාණයකට ඇතුළුවී එය බුත්ති විඳිතහොත් කොමසාරිස්වරයා විසින් ලිඛිත නියමයක් මගින්, එම නියමයේ නියමිත දින හෝ ඊට පෙර එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් විය යුතු යයි ඒ තැනැත්තාට නියම කළ යුතු ය. ඒ තැනැත්තා එම නියමයට අනුකූල වීමට අපොහොසත් වුවහොත්, 6 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කරනු ලැබිය යුතු ය.

අද ගොවියකු පත් කිරීමට කොමසාරිස්වරයාට ඇති බලය.

**15.** (1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් අද ගොවියකු නොමැති අවස්ථාවක දී සහ පිට පිට ම එළඹෙන කන්න දෙකක දී හෝ ඊට වැඩි ගණනක දී, ඒ කුඹුරු ප්‍රමාණය වගා නොකරනු ලැබූ අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, කොමසාරිස්වරයාගේ මතය අනුව එළඳායී නොවන යම් කුඹුරු ප්‍රමාණයක ගොවියකු, මුලින් සඳහන් කළ කුඹුරු ප්‍රමාණයෙහි අද ගොවියා වශයෙන් කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින් යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන්—

(අ) තමන් එසේ කිරීමට අදහස් කරන බව ඒ ප්‍රමාණයෙහි ඉඩම් හිමියාට ලිඛිත දැන්වීමක් කර දැනුම් දී ඇතහොත් මිස; සහ

(ආ) එවැනි පත් කිරීමක් කිරීමට විරුද්ධව සැහෙන හේතු ඒ දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත දක්වීමට ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා අපොහොසත් වී ඇතහොත් මිස,

(1) වන උපවගන්තිය යටතේ කිසිම පත් කිරීමක් නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි පළමුව සඳහන් කළ ආකාරයේ යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන්, ඒ උපවගන්තිය යටතේ, අද ගොවියකු පත් කරනු ලබන අවස්ථාවෙහි, එයට ඇතුළු වී එය බුක්ති විඳින යම් තැනැත්තකු සිටින විට, කොමසාරිස්වරයා විසින් ලිඛිත නියමයක් මගින්, ඒ නියමයෙහි නියමිත දිනයෙහි හෝ ඊට පෙර, ඒ කුඹුරු ප්‍රමාණය අත්හැර යන මෙන් ඒ තැනැත්තාට නියම කළ යුතු ය. ඒ තැනැත්තා ඒ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැරිය හොත් 6 වන වගන්තියේ විධිවිධාන අනුව ඒ තැනැත්තා ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කළ යුතු ය.

යම් කුඹුරු ප්‍රමාණයක් වගා නොකිරීම ඉඩම් හිමියාට සහ කොමසාරිස්වරයාට නිවේදනය කළ යුතු බව.

**16.** යම් කුඹුරු ප්‍රමාණයක අද ගොවියකු, වී ගොවිතැන් කරන යම් කන්නයක ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අපොහොසත් වූ අවස්ථාවක, ඒ කන්නයේ දී තමා ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අපොහොසත් බව ඔහු විසින් ඒ කන්නය ආරම්භවීමට පෙරාතුව ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ කොමසාරිස්වරයාට ලියවිල්ලකින් නිවේදනය කළ යුතු ය. තවද, ඉඩම් හිමියා විසින්, කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව එම කන්නය සඳහා පමණක් මිස ඉන් පසු නොවන පරිදි එම කුඹුරු ප්‍රමාණය වගා කිරීම පිණිස තමා ම හෝ වෙනත් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

කොමසාරිස්වරයා විසින් බද්ද නිශ්චය කළ යුතු බව.

**17.** (1) යම් කුඹුරු ප්‍රමාණයක අද ගොවියා විසින් ගෙවිය යුතු බද්ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස්වරයා විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කලින් කල නිශ්චය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චයෙන්, එම නිශ්චය බලපාන ප්‍රදේශයේ පිහිටි යම් කුඹුරු ප්‍රමාණයක වගා කළ එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් පහළොවකට නොවැඩි ගණනක් හෝ එම කුඹුරු ප්‍රමාණයෙන් උපදවන මුළු අස්වැන්නෙන් මේ පනත යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ

විට, ඉතිරි කොටසින් හතරෙන් එක් පංගුවකට නොවැඩි කොට සක් හෝ යන දෙකින් වඩා වැඩි ප්‍රමාණය ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කරන එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද වශයෙන් නියම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ පරිපාලන දිස්ත්‍රික්ක යක විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත බද්ද, ගොවිතැන් කළ එක් එක් අක්කරයක් සඳහා නියමිත වී බුසල් ගණන අනුව ගණන් බලනු ලබන විට, ගොවිතැන් කරන ලද අක්කරයකට අඩු බිම් ප්‍රමාණයක් සඳහා වූ බද්ද, ඒ බිම් ප්‍රමාණයත් අක්කරයත් අතර ඇති අනුපාතය අනුව ගණන් බැලිය යුතු ය.

(5) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා එක් එක් කන්නයෙහි දී ගෙවිය යුතු බද්ද—

(අ) මේ වගන්තියේ ඉහත කී විධිවිධාන යටතේ බලපවත්වන එවැනි නිශ්චය අනුව එම කුඹුරු ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ කුඹුරු කෙරෙහි අදාළ වන ආකාරයෙන් එම කුඹුරු ප්‍රමාණයට ගණන් ගත් වී ප්‍රමාණය, හෝ

(ආ) ඉඩම් හිමියා බද්ද මුදලින් ලබා ගැනීමට කැමති වූ විට සහ අද ගොවියා බද්ද මුදලින් ගෙවීමට එකඟ වූ විට, එකී කුඹුරෙන් නිපද වූ වර්ගයේම වී සඳහා මේ පනතේ විධිවිධානවලට අනුකූලව තත්කාලයේ නියමිත මිල අනුව ගණන් බැලූ විට, මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ වීවලින් ගෙවිය යුතු බද්දට සමාන මුදල

විය යුතු ය.

(6) යම් කුඹුරු ප්‍රමාණයක් ගොවිතැන් කළ හැකිව තිබියදීත් යම් කන්නයක, ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කිරීම එහි අද ගොවියා විසින් හිතාමතාම නොසලකා හැර ඇතැයි හෝ වී ගොවිතැන් කරන යම් කන්නයක දී සෑහෙන හේතුවක් නොමැතිව ගොවිතැන් කිරීමට අදාළ යම් සම්මත චාරිත්‍රයක් කඩ කර ඇතැයි කොමසාරිස්වරයා සෑහීමට පත් වූ විට, එම කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ ඒ කන්නය සඳහා වීවලින් ගෙවිය යුතු බද්ද ඒ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරන පදනම මත ගණන් බැලිය යුතු යයි කොමසාරිස්වරයා විසින් නියම කළ හැකි අතර, එසේ ගණන් බලන ලද වීවලින් ගෙවිය යුතු බද්ද අනුව මුදලින් ගෙවිය යුතු බද්ද ගණන් බැලිය යුතු ය.

(7) අද ගොවියකු වගා කළ කුඹුරු ප්‍රමාණයක්, වී ගොවිතැන් කරන යම් කන්නයක දී ඔහුගේ වරදින් හෝ නොසැලකිල්ලකින් නොව, අන් කිසි හේතුවක් නිසා තරමක් දුරට පාළු වී නම්, එම

කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් ඔහු විසින් ඒ කන්නය සඳහා ගෙවිය යුතු බද්ද, කොමසාරිස්වරයා විසින් නිශ්චය කරන සාධාරණ ප්‍රමාණයකින් අඩු කළ යුතු ය.

(8) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා සහ ඔහුගේ ඉඩම් හිමියා අතර, ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමක් යටතේ ගෙවිය යුතු බද්ද මුදල පිළිබඳව යම් ආරවුලක් ඇති වූ විට, ඒ පිළිබඳව තීරණයක් කිරීම සඳහා, ඒ ආරවුල කොමසාරිස්වරයා වෙත යොමු කළ හැකි ය. ඒ ආරවුල සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණය ඒ අඳ ගොවියාට සහ ඔහුගේ ඉඩම් හිමියාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

අඳ ගොවියා විසින් බද්ද ගෙවීම පැහැර හැරියවිට ඇති වන ප්‍රතිඵලය.

18. (1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීම අඳ ගොවියා හිඟ තබා ඇති බව ඉඩම් හිමියා කොමසාරිස්වරයාට දන්වා සිටි විට, එම හිඟ බද්ද නොගෙවූ බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වීමෙන් පසු, කොමසාරිස්වරයා අඳ ගොවියාට ලිඛිත දැනුම් දීමක් කරමින්, එම දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත එම හිඟ මුදල ගෙවීමට තමා පැහැර හැරියහොත් එම කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් ඔහුගේ අඳය අවසන් කරන බව ලිඛිතව දන්වා සිටිය යුතු ය.

(2) හිඟ බද්ද ගෙවීමට නියමිත කාලය තුළ දී, එය ගෙවීම පැහැර හරින අඳ ගොවියකුට, ඔහුගේ අඳය අහිමි වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, කොමසාරිස්වරයා විසින් එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්ව යන ලෙස නියෝග කරනු ලැබූ කල්හි එසේ ඉවත්ව යා යුතු ය.

(3) නියමයෙහි සඳහන් කරනු ලැබූ කාලය ඇතුළත එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්ව යාමට අඳ ගොවියා පැහැර හැරියහොත් 6 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එම කුඹුරු ප්‍රමාණයෙන් අඳ ගොවියා අස් කිරීමට කොමසාරිස්වරයා කටයුතු සැලැස්විය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව අඳ ගොවියකුගේ අඳ අයිතිවාසිකම් අවසන් කරනු ලැබූ විට, කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව—

(අ) නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසි මත එම කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අයිතිකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට හිමිකම් තිබිය යුතු ය ; නැතහොත්

(ආ) නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත එම කුඹුරු ප්‍රමාණය සඳහා අඳ ගොවියන් එක් කෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කිරීම අයිතිකරු විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් කළ යුතු ය.

(5) නියමිත කාලසීමාව ඇතුළත (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කටයුතු කිරීමට ඉඩම් හිමියා අපොහොසත් වූ විට, එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා ලෙස සුදුසු තැනැත්තකු කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

බද්ද නොගෙවිය යුතු අවස්ථා.

**19.** අඳ ගොවියකුගේ කුඹුරු ප්‍රමාණය වී ගොවිතැන් කරන යම් කන්නයක දී ඔහුගේ වරදකින් හෝ නොසැලකිල්ලකින් නොව, අන් කිසි හේතුවක් නිසා වගා නොකරන ලද නම් හෝ එම කන්නය තුළ ඒ කුඹුරු ප්‍රමාණයේ කළ වගාව සහමුලින් ම පාළු වී නම්, ඒ කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් එම කන්නය සඳහා බද්දක් නොගෙවිය යුතු ය.

බද්ද ගෙවිය යුතු කාලය, ස්ථානය සහ බද්ද හිඟවීමට පටන් ගැනීම.

**20.** වී ගොවිතැන් කරන යම් කන්නයක් සඳහා ගෙවිය යුතු බද්ද එම කන්නයේ දී එම කුඹුරු ප්‍රමාණයෙන් අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරුව තිස්වන දිනයේ හෝ ඊට පෙර කමතේ දී ගෙවිය යුතු ය. එසේ නොගෙව්වහොත් එකී තිස්වන දිනයට පසු පළමුවන දිනයේ පටන් බද්ද හිඟවීමට පටන් ගන්නේ ය.

ගොයම් කපා පාගා ගැනීමේ සහ අවත් කර ගැනීමේ දින අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට දැන්විය යුතු බව.

**21.** (1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් තම ඉඩම් හිමියා සහ ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයයෙහි බලය ඇති වගා නිලධරයා වෙත—

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ අස්වැන්න කපා පාගා ගැනීම ආරම්භ කිරීමට අදහස් කරන දිනය යටත් පිරිසෙයින් දින දහයක් කල් ඇතිව දැන්වීම; සහ

(ආ) කුඹුරු ප්‍රමාණයෙන් කපා පාගා ගන්නා ලද අස්වැන්න කමතෙන් ඉවත් කර ගැනීමට අදහස් කරන දිනය යටත් පිරිසෙයින් දින හතක් කල් ඇතිව දැන්වීම

ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියාගේ කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ විධිවිධාන වලට අනුකූලවීම පැහැර හරින යම් අඳ ගොවියකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

කාහට බද්ද ගෙවිය යුතු ද යන බව.

**22.** (1) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා බද්ද එහි අඳ ගොවියා විසින් එම කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට කෙළින් ම හෝ ඒ බද්ද භාර ගැනීම ඒ ඉඩම් හිමියා පැහැර හරින නැතහොත් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක ගොවිජන සේවා කාරක සභාව මාර්ගයෙන් හෝ ගෙවිය යුතු ය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක අයිතිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් වූ විට, එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියාගෙන් බද්ද අය කර ගැනීම සඳහා ඔවුන් විසින් එක් තැනැත්තකු පත් කළ යුතු අතර, ඒ සඳහා පත් කළ තැනැත්තාගේ නම සහ ලිපිනය ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයයෙහි බලය ඇති ගොවිජන සේවා කාරක සභාව වෙත ලියවිල්ලකින් දන්වා යැවිය යුතු ය. එසේ පත්වීමක් නොකළ කල්හි, එම බද්ද එම කුඹුරු හිමියන් වෙනුවෙන් සිරිත් පරිදි එවැනි බදු අය කරන යම් තැනැත්තකු වේනොත්, ඒ තැනැත්තාට කෙළින් ම හෝ එකී කාරක සභාව මඟින් හෝ ගෙවිය යුතු ය.

(3) ඒ බද්ද එකතු කිරීමට හිමිකම් ඇති තැනැත්තකු නොමැති නම් හෝ ඒ බද්ද එක් එක් ඉඩම් හිමියාට කවර අනුපාතයක් අනුව ගෙවිය යුතු ද යන්න පිළිබඳව හෝ ඒ බද්ද ගෙවනු ලැබිය යුතු තැනැත්තා පිළිබඳව යම් ආරවුලක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන අනුව මුදලින් ගණන් බලන ලද ඒ බද්ද ඒ අඳ ගොවියා විසින් ඒ කාරක සභාවට ගෙවිය යුතු අතර, ඒ කාරක සභාව විසින් එය ලබා ගැනීම පිණිස ඒ බද්ද ගැන ක්‍රියා කිරීමේ දී ඒ කාරක සභාව විසින් දරන ලද වියදම එයින් අඩුකොට එය ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගැනීමට ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය දරන දිසා අධිකරණයට ගෙවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ ප්‍රමාණය, ඊට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින්, ඒ මුදල ඒ අධිකරණයට ගෙවනු ලැබූ දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ලබා ගනු නොලැබූ අවස්ථාවක, ඒ අධිකරණය විසින් ඒ මුදල ගොවිජන සේවා අරමුදලට ගෙවීමට සැලැස්විය යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය ඉන්පසු ඉල්ලා සිටීමට හෝ භාර ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකම් නොතිබිය යුතු ය.

ගොවිජන සේවා කාරක සභාව මගින් ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට බද්ද ගෙවන අවස්ථාවේදී අදාළ විය යුතු විධිවිධාන.

23. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි බද්ද ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට ගෙවනු වෙනුවට, ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශය විෂයයෙහි බලය ඇති ගොවිජන සේවා කාරක සභාවට ගෙවනු ලබන අවස්ථාවක, ඒ කාරක සභාව විසින්—

(අ) ඒ බද්ද මුදලින් ගෙවනු ලැබුවේ නම්, ඒ බදු මුදල් ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම් හිමියා වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත යැවීමට ; නැතහොත්

(ආ) ඒ බද්ද වීවලින් ගෙවනු ලැබුයේ නම්, දැන්වීමේ දින යෙන් පසු දින තිහක් ඇතුළත ඒ බද්ද බාරගන්නා මෙන් අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම් හිමියා වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත ලිඛිත දැන්වීමක් යැවීමට ; සහ

(ඇ) ඒ බද්ද පිළිබඳව ක්‍රියා කිරීමේ දී ඒ කාරක සභාව විසින් දරන්නට සිදු වූ යම් වියදම් ඒ බද්දෙන් අඩු කර ගැනීමට ද සැලැස්විය යුතු ය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා වූ බද්ද ගොවිජන සේවා කාරක සභාවට වීවලින් ගෙවා ඇති අවස්ථාවක එයට හිමිකම් ඇති තැනැත්තා වෙත යවනු ලැබූ (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමෙහි දිනයෙන් පසු දින තිහක් ඇතුළත ඔහු එය ඉල්ලා සිටීම කර නැත්තා වූ ද අවස්ථාවක, ඒ ගොවිජන සේවා කාරක සභාව විසින් ඒ වී විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල ඒ තැනැත්තා වෙත යැවීමට සැලැස්විය යුතු ය.

(3) ගොවිජන සේවා කාරක සභාව විසින් මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට (මුදල් ඇණවුමකින් හෝ තැපැල් ඇණවුමකින් නොවන අන් ලෙසකින්) යවනු ලැබූ යම් මුදලකට, ඒ මුදල යවනු

ලැබූ දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ඒ තැනැත්තා විසින් හිමිකම් කියා නොසිටි අවස්ථාවක ඒ මුදල ඒ කාරක සභාව විසින් ගොවිජන සේවා අරමුදලට ගෙවිය යුතු ය. ඒ මුදල හෝ ඒ මුදල යම් බද්දක් වෙනුවෙන් වූ විට ඒ බද්ද හෝ ඉල්ලා සිටීමට හෝ බාර ගැනීමට ඉන්පසු කිසිම තැනැත්තකුට හිමිකම් නොතිබිය යුතු ය.

ගෙවූ බද්ද සඳහා කුවිතාන්සියක් දිය යුතු බව.

24. (1) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා බදු එකතු කිරීමට අයිතිය ඇත්තකු බද්ද බාරගත් කල්හි—

(අ) ගෙවූ දිනය;

(ආ) බදු ගෙවූ තැනැත්තා;

(ඇ) ගෙවන ලද බදු මුදලේ ප්‍රමාණය;

(ඈ) බදු ගෙවන ලද කාලසීමාව; සහ

(ඉ) බදු ගෙවන ලද්දේ කුමන කුඹුරක් සම්බන්ධයෙන් ද

යන කරුණු දැක්වෙන කුවිතාන්සියක් එම බද්ද ගෙවූ තැනැත්තාට නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බදු එකතු කිරීමට හිමිකම් ඇති තැනැත්තකු, ඒ උපවගන්තියට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත් මේ පනත යටතේ ඔහු වරදකට වරදකරු විය යුතු ය.

හිඟ බද්ද වෙනුවෙන් පොලී ගෙවිය යුතු බව.

25. යම් කුඹුරු ප්‍රමාණයක බද්ද හිඟ බවට පැමිණි විට මේ පනතේ විධිවිධාන අනුව මුදලින් ගණන් බැලූ හිඟ බද්ද වෙනුවෙන් නියමිත ප්‍රමාණයක සුළු පොලියක් ගෙවිය යුතු ය.

හිඟ බවට පැමිණි බදු සහ පොලී අයකර ගැනීම.

26. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියාගෙන් හිඟ බවට පැමිණි බදු වශයෙන් හෝ ඒ බද්ද වෙනුවෙන් වූ පොලී වශයෙන් හෝ ඒ දෙවිධියෙන් ම හෝ ඔහුගේ ඉඩම් හිමියාට යම් මුදලක් අයවිය යුතු ව ඇති විට, නියමයක් කරන ලෙස, ඒ ඉඩම් හිමියා විසින් කොමසාරිස්වරයාට ඉල්ලුම් කළ හැකි අතර, එසේ ඉල්ලුම් කරනු ලැබූ විට, යථා පරිදි විභාගයක් පැවැත්වීමෙන් පසු, කොමසාරිස්වරයා විසින්, ඒ අඳ ගොවියාගෙන් අයවිය යුතුව ඇති කවර හෝ මුදලක් ගෙවන ලෙස අඳ ගොවියාට නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයෙන් දෙන ලද කාලය තුළ ඒ මුදල ගෙවීම ඒ අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත් බද්ද ගෙවීමට ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම පිහිටා ඇති ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයට ඉඩම් හිමියා විසින් කරන ලද ඉල්ලීමක් අනුව, එම මුදල, එය එම අධිකරණය විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන් අය කර ගත හැකි අතර, එසේ අය කර ගනු ලැබූ යම් මුදලක්, ඒ අධිකරණය විසින් ඉල්ලුම්කාර ඉඩම් හිමියාට ගෙවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ඉඩම් හිමියාට ඒ මුදල අය විය යුතු බවට වූ කොමසාරිස්වරයාගේ සහතිකය, ඒ මුදල අය විය යුතු බවට තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

## II වන කොටස

### නියමිත බැංකු විසින් වගාව සඳහා දෙනු ලබන ණය සම්බන්ධයෙන් අදාළ විය යුතු විධිවිධාන

නියමිත බැංකු මගින් දෙනු ලබන ණය සම්බන්ධයෙන් වූ නියමයන් හා කොන්දේසි.

27. (1) යම් කෘෂිකාර්මික ඉඩමක, ඉඩම් හිමි ගොවියා හෝ බුත්ති කරු විසින් නියමිත ආකෘතියක සාරානුකූල වූ සාධන පත්‍රයක් පිටපත් දෙකකින් යුක්තව ලියා අත්සන් කොට එම ඉඩම් හෝ ඔහුට අයිති හෝ ඔහුට සම්බන්ධතාවක් ඇති වෙන යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් උකසක් හෝ බැඳීමක් ඇති කිරීමෙන් හෝ එවැනි සාධන පත්‍රයක් ලියා අත්සන් නොකර නියමිත බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත හෝ ඔහුට ණයක් ලබා ගත හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සාධන පත්‍රයක් සඳහා අය කළ හැකි මුද්දර ගාස්තුව, ඒ හා සමාන බැඳුම්කරයක් හෝ උකස්කරයක් සඳහා මුද්දර ආඥාපනතේ 'අ' උපලේඛනය යටතේ අයකළ හැකි ගාස්තුවෙන් පහෙන් පංගුවකට සමාන ගාස්තුවක් පමණක් වේ. ඒ ගාස්තුව සාධන පත්‍රයේ අනු පිටපත සඳහා ගෙවිය යුතු අතර, ඒ සාධන පත්‍රයේ මුල් පිටපත හෝ ප්‍රති රූප පිටපත ඒ සඳහා ගෙවිය යුතු කිසියම් ගාස්තුවක් වේ නම්, එයින් නිදහස් විය යුතු ය.

(3) සෑම නියමිත බැංකුවක්—

(අ) මේ වගන්තිය යටතේ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍ර, ඒවා ලියා අත්සන් කරනු ලබන අනු පිළිවෙළ අනුව අනුගාමී සම්පූර්ණ සංඛ්‍යාවලින් අංක කරනු ලැබීමට සැලැස්විය යුතු ය ;

(ආ) එක් එක් මාසයේ පසළොස් වන දිනට පෙර, ඒ මාසයට කලින් වූ මාසය තුළ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරන ලද එබඳු සියලුම සාධන පත්‍රවල අනු පිටපත් ඒ සාධන පත්‍රවල ලැයිස්තුවක් ද සමග, ඒ නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම හෝ යැවීම කළ යුතු ය ;

(ඇ) එක් එක් සතියේ බදාදා හෝ ඊට පෙර ලැබෙන ලෙස, ඒ සතියට කලින් වූ සෙනසුරාදා දිනයෙන් අවසන් වන සතිය තුළ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරන ලද එබඳු සාධන පත්‍රවල ලැයිස්තුවක්, ඒ නියමිත බැංකුව තම කට යුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම හෝ යැවීම කළ යුතු ය ;

(ඈ) එබඳු යම් සාධන පත්‍රයක් නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කය නොවන දිස්ත්‍රික්කයක පිහිටි යම් ඉඩමක් හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන්නේ නම්, ඒ සාධන පත්‍රයේ පිටපතක් එම ඉඩම හෝ නිශ්චල දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත එසේ දෙවනු කී දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම්වලට හෝ නිශ්චල දේපළවලට අදාළ සියලුම සාධන පත්‍රවල ලැයිස්තු වක් ද සමග ඊළඟ මාසයේ පසළොස්වන දින හෝ ඊට ප්‍රථම භාරදීම හෝ කළ යුතු ය ; තව ද

(ඉ) ඒ සාධන පත්‍රය ඇටෝර්නි බලකරුවකු විසින් ලියා අත්සන් කරනු ලැබුවේ නම්, ඒ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක්, එම සාධන පත්‍රයේ ද පිටපතක් සමග එම ඉඩම හෝ නිශ්චල දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කවර වූ හෝ සාධන පත්‍රයක් අත්සන් කිරීම ණය මුදල දෙන බැංකුවේ හෝ කාර්යාලයේ කළමනාකරු හෝ ඒ බැංකුවේ යම් නියමිත තනතුරක් දරන යම් තැනැත්තකු සහ තවත් සාක්ෂිකරුවකු ද ඉදිරියේ කළ හැකි අතර, එය ලියා අත්සන් කිරීම සහතික කිරීම ඒ කළමනාකරු හෝ ඒ වෙනත් තැනැත්තා සහ එකී සාක්ෂිකරු විසින් ද කළ හැකි ය. තව ද ඒ සාධන පත්‍රය එසේ අත්සන් කරනු ලැබ සහතික කරනු ලැබූ අවස්ථාවක, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ කිසිවක් එයට අදාළ නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් යම් සාධන පත්‍රයක් ඉඩම් කෙරෙහි බලපෑමක් ඇති සාධන පත්‍රයක් වශයෙන් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

28. මේ කොටසේ විධිවිධාන යටතේ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ අනුරූප විධිවිධාන යටතේ හෝ නියමිත බැංකුවක් විසින් යම් කෘෂිකාර්මික ඉඩමක් අයිති ගොවියකුට හෝ බුත්තිකරුවකුට දෙන ලද ණයක් වෙනුවෙන් අය විය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ මුදල අයවිය යුත්තේ මුල් මුදලින් හෝ පොලියෙන් හෝ දෙකින්ම හෝ වුව ද, ඒ ණය මුදල නොගෙවා ඇති සම්පූර්ණ කොටස හා ඊට අදාළ පොලිය ගෙවීම පැහැර හැරීමක් ලෙස එය සැලකිය යුතු ය. ගෙවීම පැහැර හැරීම.

29. (1) මේ කොටසේ විධිවිධාන යටතේ, යම් ණයකින් නොබේරු හෝ නොපියවූ සම්පූර්ණ කොටස් සහ ඊට අයත් පොලිය ගෙවීම පැහැර හරිනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවක, එම ණය දෙනු ලැබුවේ යම් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද, ඒ කෘෂිකාර්මික ඉඩම අයිති ගොවියා හෝ එහි බුත්තිකරු දැන්වීමේ සඳහන් මුදල ගෙවීම පැහැර හැර ඇති බව කොමසාරිස්වරයා වෙත නියමිත බැංකුව විසින් නිවේදනය කළ හැකි ය. ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක නියමිත බැංකුව විසින් ගත යුතු ක්‍රියා මාර්ගය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමක් ලැබුණු පසු ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු හෝ බුත්තිකරු ඒ මුදල ගෙවීම පැහැර හැර තිබේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් විභාගයක් පැවැත්විය හැකි ය.

(3) ඒ විභාගයේ දී පෞද්ගලිකව හෝ නියෝජිතයකු මගින් කරුණු කියා සිටීමේ අවස්ථාවක්, කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම්හිමි ගොවියාට හෝ එහි බුත්තිකරුට සහ නියමිත බැංකුවට දිය යුතු ය.

(4) කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම්හිමි ගොවියාගෙන් හෝ එහි බුත්තිකරුගෙන් නියමිත බැංකුවකට යම් මුදලක් අයවිය යුතු බවට ඒ විභාගයේ දී කොමසාරිස්වරයා සෑහීමට පත් වුව හොත් නියමිත

බැංකුවට අයවිය යුතු මුදල විධානයෙන් නියම කරනු ලැබිය හැකි කාලය තුළ දී ගෙවන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම් හිමි ගොවියාට හෝ එහි බුත්තිකරුට හෝ කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම් හිමි ගොවියාගේ හෝ එහි බුත්තිකරුගේ උරුමක්කාරයකුට හෝ නීත්‍යානුකූල නියෝජිතයකුට හෝ නියම කළ යුතු ය.

(5) නියමිත බැංකුවට ගෙවීමට තමාට නියම වූ යම් මුදලක් සම්බන්ධයෙන් (4) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව ක්‍රියා කිරීම කෘෂිකාර්මික ඉඩමක ඉඩම්හිමි ගොවියා හෝ එහි බුත්තිකරු පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, එම කෘෂිකාර්මික ඉඩම පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයට නියමිත බැංකුව වෙනුවෙන් යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් අනුව එම මුදල, එම අධිකරණය විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ ප්‍රමාණය ඉක්ම වන්නේ වුව ද, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන් අයකර ගත හැකි ය.

(6) (5) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් පැහැර හරින්නකු ගෙන්, යම් මුදලක් නියමිත බැංකුවට අයවිය යුතු බවට වූ සහතිකයක් නිකුත් කිරීමට බලය දෙනු ලැබූ නිලධරයකු විසින් ඒ මුදල අයවිය යුතු බවට තම අත්සන යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබූ විට ඒ මුදල ඒ තැනැත්තාගෙන් ඒ බැංකුවට අයවිය යුතු බවට එය තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය:

එසේ වුව ද ඒ බුත්තිකරු අඳ ගොවියකු වී, (5) වන උපවගන්තියෙහි විධිවිධාන සලසනු ලැබූ ආකාරයෙන් ඒ මුදල අයකර ගැනීම කළ නොහැකි බව හෝ අවස්ථාවෝචිත නොවන බව නියමිත බැංකුව විසින් කොමසාරිස්වරයා වෙත වාර්තා කරනු ලබන අවස්ථාවක, විධිවිධාන සලසනු ලැබ ඇති ආකාරයෙන් ඒ මුදල අයකර ගැනීමට නොහැකි බව කොමසාරිස්වරයා සෑහීමට පත්වන විට, ඒ මුදල නියමිත බැංකුවට ගෙවනු ලබන තෙක් ඒ පැහැර හරින්නාගේ අඳ අයිතිවාසිකම් කොමසාරිස්වරයා විසින් අත්හිටුවිය හැකි ය.

නියමිත බැංකුව විසින් දෙන ලද ණයක් නිසා ඇති වූ බැඳීමක ප්‍රමුඛත්වය.

**30.** තත්කාලයෙහි බලපවත්වන යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, නියමිත බැංකුවක් විසින් යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියකුට හෝ එහි බුත්තිකරුවකුට දෙන ලද ණයක් සම්බන්ධයෙන් යම් ඉඩමක් හෝ එහි සම්බන්ධතාවක් කෙරෙහි නියමිත බැංකුවක වාසියට ඇති කරන ලද යම් බැඳීමක් හෝ උකසක්, එම බැඳීම හෝ උකස ඇති කරන ලද දිනයට පෙරාතුව එම ඉඩම හෝ එහි සම්බන්ධතාව කෙරෙහි යම් තැනැත්තකුගේ වාසියට ඇති කරනු ලැබ තිබිය හැකි වෙනත් යම් බැඳීමකට හෝ උකසකට වඩා ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

ආපසු අයකර ගැනීමේ අනිකුත් ක්‍රම භාවිත කිරීමෙන් නියමිත බැංකු වළකා නැති බව.

**31.** නියමිත බැංකුවකට අය විය යුතු මුදල වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව එම බැංකුව විසින් ආපසු අයකර ගැනීම 29 වන වගන්තියේ කිසිවකින් වැළැක්වෙතැයි නොසැලකිය යුතු ය.

32. ණය සහනදායක ආඥාපනතේ කිසිවක් යම් නියමිත බැංකුවකට අයවිය යුතු ණයකට අදාළ නොවන අතර, ඒ කිසිවක් ඒ ණයට අදාළ වන ලෙස හෝ ඒ ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් යම් නියමිත බැංකුවකට ඇති අයිතිවාසිකම්වලට ඉන් හානියක් වන ලෙස හෝ ඒ අයිතිවාසිකම් කෙරෙහි එය බල පාන ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.

ණය සහන දායක ආඥා පනත නියමිත බැංකුවකට අයවිය යුතු ණයවලට අදාළ නොවන බව.

## III වන කොටස

### කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂම ලෙස වගා කිරීම

33. යම් කෘෂිකාර්මික ඉඩමක ප්‍රමාණය, පිහිටීම සහ ස්වාභාවික සම්පත් සැලකිල්ලට ගෙන ඒ ඉඩමට ඉතා ම ගැලපෙන බෝග වර්ග එහි වගා කිරීම හෝ සත්ව වර්ග ඇති කිරීම සහ මේ පනත මගින් මෙහි මින් මතු සලස්වා ඇති හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග මගින් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර වගාකිරීමේ සම්මතයන්ට අනුකූලව නිෂ්පාදනවල තත්ත්වය හා ප්‍රමාණය යන දෙ අංශයෙන්ම ඵලදාවර්ධනය දියුණු කිරීමේ සහ නිෂ්පාදනය විෂයෙහි කාර්යක්ෂම සම්මත තත්ත්වයන් පවත්වාගෙන යාමේ අරමුණ ඇතිව ඒ ඉඩම වගා කිරීම, යම් කෘෂිකාර්මික ඉඩමක සෑම ඉඩම් හිමි ගොවියකුගේ ම හෝ බුත්තිකරුවකුගේ ම කාර්ය විය යුතු ය.

කෘෂිකාර්මික ඉඩම්වල ගොවිතැන් කිරීමට සහ ඒ ඉඩම් පාලනය කිරීමට අදාළව ඉඩම් හිමි ගොවියන් හෝ බුත්තිකරුවන් සතු කාර්ය.

34. (1) 33 වන වගන්තියේ විධිවිධානවල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිදි, යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම්හිමි ගොවියා හෝ එහි බුත්තිකරු විසින්, මෙම පනතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ නිශ්චිතව සඳහන් පරිදි —

(අ) තම කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන් වූ සියලු කාර්ය සහ බැඳීම් ඉටු කළ යුතු ය; තව ද

(ආ) තම ඉඩම පිහිටා ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රදේශයේ, යායේ හෝ බිම් කට්ටි සමූහයේ ඵලදාවර්ධනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මේ පනතේ නියමිත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගවලින් වූ සියලු බැඳීම් ඉටු කළ යුතු ය.

මනා පාලනය පිළිබඳ සම්මතයන්.

(2) යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා හෝ එහි බුත්තිකරු, කොමසාරිස්වරයා විසින් තම අභිමතය පරිදි නිශ්චය කරනු ලැබිය හැකි සෙසු කාර්යයන්ට අමතරව—

(අ) නිර්දේශ කරනු ලැබූ බෝග ජාති හා වර්ග වගා කිරීමට සහ සතුන් වර්ග පමණක් ඇති කිරීමට;

(ආ) ඒ කෘෂිකාර්මික ඉඩම පිරිසිදුවත් මනා තත්ත්වයක වගාවකින් හා සාරවත් භාවයකින් යුක්තවත් දිය බැස යාම පිළිබඳ නිසි ක්‍රමයක් ඇතුළුව මනා තත්ත්වයකින් යුක්තවත් පවතින ආකාරයට එම ඉඩමේ බෝග වැවීමට;

(ඇ) වාරිමාර්ග ජලය කාර්යක්ෂම ලෙස යෙදීමට;

(ඈ) පස සහ ජලය උපරිම අන්දමින් ආරක්ෂාවීම සහතික වන ආකාරයට ඉඩම යථා පරිදි පවත්වා ගෙන යාමට;

(ඉ) රසායන පොර හෝ වෙනත් පොර වර්ග සෑහෙන ප්‍රමාණවලින් යෙදීමෙන් පසෙහි සාරවත් භාවය වැඩි දියුණු කිරීමට සහ පවත්වා ගැනීමට;

(ඊ) භාරගෙන ඇති කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල පිළිවෙල අනුව බෝග වගා කිරීමෙහි හෝ සතුන් ඇති කිරීමෙහි ලා කාර්යක්ෂම පාලන සම්මත තත්ත්වයක් පවත්වාගෙන යාමට ;

(උ) බෝග සහ සතුන් රෝගවලින් තොරව සහ කෘමීන් හා සෙසු පළිබෝධක ගහනයෙන් තොරව ආරක්ෂා කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගැනීමට ;

(ඌ) වැඩෙන අවස්ථාවේ පවතින බෝග සහ නෙලා ගනු ලැබූ බෝග හෝ නෙලා ගනු ලබමින් පවත්නා බෝග ආරක්ෂා කිරීම සහ පරිරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ;

(එ) වෙළෙඳ පොළට යැවීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ දී නිෂ්පාදනවල ප්‍රමාණය හෝ තත්ත්වය පිළිබඳව සි විය හැකි හානිය හැකිතාක් අඩු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ; සහ

(ඒ) අවශ්‍ය කවර විට දී වුව ද නඩත්තු කිරීමේ සහ අලුත් වැඩියා කිරීමේ කටයුතු කිරීමට

වගබලා ගත යුතු ය.

(3) යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා හෝ එය බුත්තිකරු විසින්, නියමිත යම් ප්‍රදේශයකට, යායකට හෝ කෘෂිකාර්මික බිම් කට්ටි සමූහයකට අයත් ඉඩම් පිළිබඳ පොදු පාලන අවශ්‍යතා හේතු කොට ගෙන උද්ගත විය හැකි සිය යුතුකම් සහ බැඳීම් සියල්ල වෙනත් ඉඩම් හිමි ගොවීන් සහ බුත්තිකරුවන් සමග යථා පරිදි ඉටුකිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය. එම යුතුකම්වලට පහත සඳහන් කරුණු අතුරෙන් යම් කරුණක් හෝ ඒ සියල්ල ඇතුළත් විය හැකි ය :—

(අ) කෘෂිකාර්මික ක්‍රියාකාරකම් නිසි වකවානුවලට යොදා ගැනීම ;

(ආ) වාරිමාර්ග ජලය කාර්යක්ෂම ලෙස පාලනය කිරීම ;

(ඇ) පස සංරක්ෂණය කිරීම සඳහා හවුලේ කටයුතු යෙදීම ;

(ඈ) ජලය සංරක්ෂණය කිරීම සහ දිය බැස යාමට සැලැස්වීම ;

(ඉ) පළිබෝධකවලින් සහ රෝගවලින් ආරක්ෂා කිරීම ;

(ඊ) ඉඩම්වලින් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනය ගැනීම සහ කෘෂිකාර්මික පලදාවර්ධනය සැලැස්වීම සඳහා මේ පනත යටතේ නියෝග මගින් පනවනු ලැබිය හැකි අන් කිසි සාමූහික වගකීම් ; සහ

(උ) යම් කෘෂිකාර්මික නිෂ්පාදන අස්වනු නෙලාගැනීමත් ඒවා අලෙවි කිරීමත් අතර තිබිය යුතු කාලසීමාව අනුගමනය කරන බවට වගබලා ගැනීම.

(4) (1) වන, (2) වන හෝ (3) වන උපවගන්ති යටතේ තමා වෙත පවරනු ලැබූ වගකීම් ඉටු කිරීම පැහැර හරින ඉඩම් හිමි ගොවියකු හෝ බුත්තිකරුවකු වරදකට වරදකරු විය යුතු ය.

ඉඩම් හිමි ගොවියකු හෝ බුත්තිකරුවකු කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ තබන නියමය.

35. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව යම් කෘෂිකාර්මික ඉඩමක් ගොවිතැන් නොකරනු ලබන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක කොමසාරිස්වරයා විසින්, තමා වෙත හෝ තමාගේ බලයලත් නියෝජිතයා වෙත හෝ කරුණු සැලකර සිටීමේ අවස්ථාවක් ඒ කෘෂිකාර්මික ඉඩමේ ගොවියාට හෝ එහි බුත්තිකරුට දීමෙන් පසු (මෙහි මින් මතු "අධීක්ෂණ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්, ඉඩම් හිමි ගොවියා හෝ බුත්තිකරු, එම නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ තැබිය හැකි ය.

(2) සෑම අධීක්ෂණ නියමයක්ම එය අදාළ වන තැනැත්තා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය:

එසේ වුව ද, ඒ ඉඩම් හිමි ගොවියන් හෝ බුත්තිකරුවන් කීප දෙනකු සිටින විට ඒ ඉඩම් හිමි ගොවියන්ගේ සහ බුත්තිකරුවන්ගේ ලිපින නිශ්චය වශයෙන් දැනගත නොහැකි අවස්ථාවක, ඒ ඉඩමෙහි හෝ එය මත ප්‍රකට ස්ථානයක ඒ නියමය ප්‍රදර්ශනය කිරීම ඒ ඉඩම් හිමි ගොවියන් හා බුත්තිකරුවන් සියල්ලන් ම වෙත නියමය භාර දෙනු ලැබීමක් ලෙස සැලකිය යුතු ය.

(3) අධීක්ෂණ නියමය වලංගුව පවතිද්දී කොමසාරිස්වරයා විසින් ඒ සඳහා බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින්—

(අ) ඒ ඉඩම ගොවිතැන් කරනු ලබන ආකාරය පරීක්ෂා කිරීමේ සහ නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා නියමය අදාළ වන ඉඩමට සියලු සාධාරණ වේලාවන්හි දී ඇතුළුවීම ද;

(ආ) මේ පනතෙහි නියම කර ඇති ගොවිතැන් කිරීමේ සම්මත තත්ත්වයන් අනුව ප්‍රස්තුත ඉඩම් හිමි ගොවියා හෝ බුත්තිකරු විසින් ක්‍රියා කරගෙන යන බවට වගබලා ගැනීම සඳහා ලිඛිත දැන්වීමකින් යම් විධානයක් නිකුත් කිරීම ද

කළ හැකි ය.

(4) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවියා හෝ බුත්තිකරු ගොවිතැන් කරන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වුවහොත්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අධීක්ෂණ නියමය කොමසාරිස්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙර දෙනු ලැබූ යම් විධානයක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම බල නොපෑ යුතු ය.

(5) අධීක්ෂණ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ දැන්වීම, අධීක්ෂණ නියමය භාර දෙනු ලැබූ ආකාරයෙන් ම භාර දෙනු ලැබිය යුතු ය.

අසන්තක කිරීමේ නියමය.

36. (1) අධීක්ෂණ නියමය අදාල වන ඉඩම් ප්‍රමාණය වගා කිරීමෙහි ලා එම නියමයේ සඳහන් කාල සීමාව තුළ දී සතුටුදායක දියුණුවක් පෙන්නුම් කර නොමැති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අසන්තක කිරීමේ නියමයක් නිකුත් කල යුතු ය. එම අසන්තක කිරීමේ නියමයෙන්, එය නිකුත් කරනු ලැබුවේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම වගා කිරීමටත් එහි අස්වැන්නටත් එම ඉඩමේ අයිතිකරුට ඇති අයිතිවාසිකම් එම නියමයේ සඳහන් කාල සීමාවකට අසන්තක වන්නේ ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අසන්තක කිරීමේ නියමය භාරදීමේ දී, 35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාල වන්නේ ය.

අසන්තක කිරීමේ නියමයෙහි සඳහන් ඉඩමෙන් පිටවී යාම.

37. (1) අසන්තක කිරීමේ නියමයක් නිකුත් කර භාර දෙනු ලැබූ විට, ඒ නියමය භාර දෙනු ලැබූ තැනැත්තා විසින් නියමයේ සඳහන් කාලසීමාව ඇතුළත නියමයේ සඳහන් ඉඩමෙන් පිට විය යුතු අතර ඒ ඉඩම පිහිටියේ යම් ගොවිජන සේවා කාරක සභාවක බල ප්‍රදේශය තුළ ද ඒ ගොවිජන සේවා කාරක සභාවට ඒ ඉඩමේ සන්තකය භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් ඉඩමක සන්තකය ගොවිජන සේවා කාරක සභාවකට පැවරෙන අවස්ථාවක දී, එම ඉඩම කාර්යක්ෂම ලෙස වගා කිරීමේ කාර්යය තහවුරු කිරීම සඳහා කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව—

(අ) ඒ ඉඩම් ප්‍රමාණය වගා කිරීම; හෝ

(ආ) ඉඩම කුඹුරක් වූ අවස්ථාවක දී, ඒ කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් අඳ ගොවියකු හෝ වැඩි දෙනකු පත් කිරීම; හෝ

(ඇ) ඒ ඉඩම්හිමියා, එහි බුත්තිකරු නොවන අවස්ථාවක දී, එම ඉඩම වගාකිරීමට ඉඩම්හිමියාට අවසර දීම; හෝ

(ඈ) ඒ ඉඩම යම් සුදුසු තැනැත්තකුට බද්දට දීම; හෝ

ඒ කාරක සභාවට කල හැකි ය:

එසේ වුවද ඒ ඉඩමේ බුත්තිකරු එහි ඉඩම් හිමියා ම වන අවස්ථාවක, ඒ කාරක සභාව විසින් හෝ මේ උපවගන්තිය යටතේ වගා කිරීම සඳහා ඒ ඉඩම දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ, ඒ ඉඩම සම්බන්ධයෙන් සහ ඒ ඉඩමට කරන ලද සියලු දියුණු කිරීම් සම්බන්ධයෙන් දරන ලද සියලු වියදම් ඉඩම් හිමියා විසින් ගෙවනු ලැබීම මත හැර, ඒ ඉඩම ඔහුට ආපසු භාර දෙනු නොලැබිය යුතු ය.

ඉඩමෙන් පිටවී යාම් පැහැර හරින තැනැත්තන් අස් කිරීම.

38. අසන්තක කිරීමේ නියමයක් භාර දෙනු ලැබූ තැනැත්තකු නියමයේ සඳහන් කාල සීමාව ඇතුළත ඉඩමෙන් පිටවී යාම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ තැනැත්තා ඉඩමෙන් අස් කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ගොවිජන සේවා කොමසාරිස්වරයා සහ ඔහුගේ නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස්වරයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය

39. (1) මේ පනතේ කාර්ය සඳහා, මේ පනතේ කොමසාරිස්වරයා යනුවෙන් හඳුන්වනු ලබන, ගොවිජන සේවා කොමසාරිස්වරයකු පත් කරනු ලැබිය හැකි ය.

ගොවිජන සේවා කොමසාරිස් වරයා, නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස් වරයන් පත් කිරීම.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්වරයන් සහ සහකාර කොමසාරිස් වරයන් සහ වෙනත් නිලධරයන් යම් ගණනක් පත් කරනු ලැබිය හැකි ය.

(3) සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ම මේ පනත යටතේ, කොමසාරිස්වරයාගේ සියලුම බලතල හෝ ඉන් යම් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) සෑම සහකාර කොමසාරිස්වරයෙක් ම, තමා සහකාර කොම සාරිස්වරයකු ලෙස පත් කරනු ලැබුවේ යම් ප්‍රදේශයක් සඳහා ද, ඒ ප්‍රදේශය තුළ මේ පනත යටතේ කොමසාරිස්වරයාගේ සියලුම බලතල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු සහ සෑම සහකාර කොම සාරිස්වරයකු ම, මේ පනත යටතේ තමන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කටයුතු ඉටු කිරීමේ දී, කොමසාරිස්වරයාගේ විධානයට සහ පාලනයට යටත් විය යුතු ය.

40. (1) කොමසාරිස්වරයා විසින් නියමිත ආකාරයට කෘෂි කාර්මික ඉඩම් හිමි ගොවීන්ට හෝ එහි බුත්තිකරුවන්ට අනන්‍යතා පත්‍ර නිකුත් කිරීම සඳහා සහ එම පත්‍ර ප්‍රතිශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට සැලැස්විය යුතු ය.

කොමසාරිස් වරයා අනන්‍යතා පත් නිකුත් කළ යුතු බව.

(2) අනන්‍යතා පත්‍ර නිකුත් කිරීමේ දී, වෙනත් දේ අතර, අවසන් වරට පවත්වාගෙන යන ලද සහතික කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩම් ලේඛනයට යොමුව සඳහන් කළ යුතු අතර ඒ අනන්‍යතා පත්‍රවල මේ පනතේ විධිවිධාන යටතේ කර ඇති සටහන්, එහි සඳහන් කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂි වන්නේ ය.

41. කොමසාරිස්වරයා, මේ පනත යටතේ හුදෙක් පරිපාලනමය වූ තමාගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට යටත් විය යුතු ය.

අමාත්‍ය වරයාගේ සාමාන්‍ය විධානයට කොමසාරිස් වරයා යටත් විය යුතු බව.

42. (1) කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින්—

කොමසාරිස් වරයාට රීති සෑදිය හැකි බව.

(අ) කුඹුරු ගොවිතැන් කිරීම හෝ වෙන යම් ආකාරයක යොවි තැන් කිරීම ;

(ආ) එම ගොවිතැන්වලට බලපාන තහවුරු වූ ව්‍යවහාර ක්‍රම ක්‍රියාවේ යෙදවීම;

(ඇ) කෘෂිකාර්මික ක්‍රියාකාරකම් නිසි වකවානුවලට යොදා ගැනීම;

(ඈ) වාරිමාර්ග ජලය කාර්යක්ෂම ලෙස මෙහෙයවීම;

(ඉ) පස සංරක්ෂණය කිරීම සඳහා සහ පළිබෝධකවලින් සහ රෝගවලින් සහ සතුන් අයාලේ යාමෙන් ආරක්ෂා කිරීම සඳහා හවුලේ පියවර යෙදීම; සහ

(ඊ) ඒ ඉඩම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට යෙදීම සහ පලදාව වර්ධනය සැලැස්වීම පිණිස කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන්ට සහ බුත්තිකරුවන්ට පවරනු ලැබූ වෙනත් යම් සාමූහික වගකීම්

ආදියට අදාළ වූ රීති සෑදීමේ කාර්යය සඳහා තමා විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රදේශයක් තුළ වූ කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවියන්ගේ හෝ එහි බුත්තිකරුවන්ගේ රැස්වීමක් කැඳවිය හැකි ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ යම් රැස්වීමක් පවත්වනු ලැබිය යුතු අවස්ථාවක දී, කොමසාරිස්වරයා විසින් හෝ ඒ වෙනුවෙන් ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලැබූ වෙන යම් තැනැත්තකු විසින්, රැස්වීමේ වේලාව සහ ස්ථානය ද එහි පරමාර්ථ ද පිළිබඳව අවස්ථානුගත සිද්ධීන් අනුව ඔහුගේ මතයේ හැටියට දිගම දැන්වීමක් කිරීමට සැලැස්විය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ දැන්වීමක්, එම රැස්වීම පවත්වනු ලැබිය යුත්තේ යම් ප්‍රදේශයක් හෝ යායක් ඇතුළත ද, ඒ ප්‍රදේශය හෝ යාය ඇතුළත වූ සුදුසු ස්ථානවල ලිඛිත දැන්වීම් ප්‍රදර්ශනය කිරීමෙන් සහ එයට ප්‍රසිද්ධිය දීම සඳහා ප්‍රමාණවත් යැයි පෙනී යා හැකි වෙනත් යම් ආකාරයකින් කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලැබූ සහ (මෙහි මින් මතු මූලාසනාරූඪ නිලධරයා යනුවෙන් හඳුන්වනු ලබන) නාමයෙන් හෝ පදවි නාමයෙන් හඳුන්වනු ලබන වෙන යම් තැනැත්තකු, මේ වගන්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලබන සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන යටතේ කැඳවනු ලැබූ රැස්වීමක් (1) වන උපවගන්තියෙන් සඳහන් කරනු ලැබූ කෘෂිකාර්මික ප්‍රදේශය තුළ ඉඩම් හිමි ගොවීන්ගේ හෝ බුත්තිකරුවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ සියයට විසිපහක් නියෝජනය කරනු ලබන ඉඩම් හිමි ගොවීන් හෝ බුත්තිකරුවන් එහි පැමිණ සිටින්නේ නම් මිස, වලංගු ලෙස සංස්ථාපනය කරනු ලැබ ඇතැයි සලකනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන යටතේ යම් රැස්වීමක දී සාදනු ලැබූ යම් රීතියක්, සභාවාරයට පැමිණ සිටින තැනැත්තන් විසින් සම්මත කරනු ලැබිය යුතු අතර, ඊට පසුව ඉඩම් හිමි ගොවීන් සහ බුත්තිකරුවන් කෙරෙහි එය අනුගම්‍ය විය යුතු ය.

(7) මේ වගන්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලැබූ යම් රැස්වීමක දී, යම් තැනැත්තකුට ඡන්දය දීමට ඇති අයිතිවාසිකම පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වූ විට, එම ප්‍රශ්නය ඒ මොහොතේ දී ම මූලාසනාරූඪ නිලධරයා විසින් තීරණය කළ හැකි අතර ඔහුගේ එම තීරණය වාර්තාවෙහි ඇතුළත් කළ යුතු අතර, එය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(8) එවැනි සෑම රැස්වීමක කටයුතුවල සම්පූර්ණ වාර්තාවක් තැබිය යුතු අතර, එය මූලාසනාරූඪ නිලධරයා විසින් අත්සන් කළ යුතු ය. තව ද එය එහි ඇතුළත් කරුණු සම්බන්ධව තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

(9) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගන්නා ලද තීරණ වලින් කිසිවක් උල්ලංඝනය කරන කෘෂිකාර්මික ඉඩමක යම් ඉඩම් හිමි ගොවියකු හෝ බුත්තිකරුවකු හෝ වරදකට වරදකරු විය යුතු ය.

(10) මේ වගන්තියේ විධිවිධාන යටතේ කැඳවනු ලැබූ රැස්වීමක දී කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් හෝ බුත්තිකරුවන් විසින් වාරිමාර්ග කටයුතු ආරක්ෂා කිරීමට සහ ඒවායින් සපයනු ලැබූ ජලය සංරක්ෂණය කිරීමට සහ කලින් කල උද්ගත විය හැකි ගොවිතැන් කිරීමට අදාළ වන වෙනත් කටයුතුවලට වගා නිලධාරීන්ට සහාය වීම පිණිස, ඔවුන් අතරින්ම නියම කරන ආකාරයට තැනැත්තන් තෝරා ගත හැකි අතර නියම කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයකට එසේ තෝරා ගනු ලැබූ යම් තැනැත්තකු හිමිකම් ලැබිය යුතු ය.

(11) එසේ තෝරා ගනු ලැබූ යම් තැනැත්තකුට ම, කොමසාරිස්වරයාගේ හෝ කොමසාරිස්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුගේ පාලනයට සහ විධානයට යටත් ව, වාරිමාර්ග සහ වගා පරිචය පිළිබඳව සහ සුළු වාරිමාර්ග කටයුතු ආරක්ෂා කිරීම සහ ඒවායින් සපයනු ලබන ජලය සංරක්ෂණය කිරීම පිළිබඳව එම ඉඩම් හිමියන්ගේ හෝ බුත්තිකරුවන්ගේ සාමූහික වගකීමට අදාළව අවශ්‍ය විය හැකි යම් පියවර ගන්නා ලෙසට කෘෂිකාර්මික ඉඩමක යම් අයිතිකරුවකුට හෝ බුත්තිකරුවකුට විධාන කිරීමට බලය තිබිය යුතු ය.

## V වන කොටස

### ගොවිජන සේවා කාරක සභා

43. (1) කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රදේශයක් සඳහා ගොවිජන සේවා කාරක සභාවක් සහ ගොවිජන සේවා මධ්‍යස්ථානයක් විය යුතු ය. ගොවිජන සේවා කාරක සභා.

(2) සෑම ගොවිජන සේවා කාරක සභාවක්ම අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එය සංස්ථා නාමයෙන් එය විසින් නඩු පැවරීම ද, එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය.

(3) ගොවිජන සේවා කාරක සභාවක සාමාජිකයන් කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඉන් අටදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් රජයේ නිලධරයන් හෝ රාජ්‍ය සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවා නියුක්තයන් වන්නා වූ ද, හය දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ඒ කාරක සභා බල ප්‍රදේශය තුළ වූ කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් හෝ බුත්තිකරුවන් අතරෙන් 42 වන වගන්තියේ (10) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තෝරා ගනු ලැබුවා වූ ද, දහහතර දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකගෙන් ඒ එක් එක් කාරක සභාව සමන්විත විය යුතු ය. ඒ කාරක සභිකයන්ට නියම කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් ලැබිය යුතු ය.

(4) ගොවිජන සේවා කාරක සභාවක සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය. එහෙත් කාලය ඉකුත් වීම නිසා සිය ධුරය දැරීම අවසන් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(5) ගොවිජන සේවා කාරක සභාවක යම් සාමාජිකයකු විසින් කොමසාරිස්වරයා වෙත ආමන්ත්‍රිත ලිපියකින් තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(6) අසනීපවීම නිසා, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ අන් හේතුවක් නිසා හෝ තම ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට ගොවිජන සේවා කාරක සභාවක සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමට කොමසාරිස්වරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) ගොවිජන සේවා කාරක සභාවක යම් සාමාජිකයකු ශාරීරික හෝ මානසික අබලතාවක් නිසා තම ධුරයේ යුතුකම ඉටු කිරීමට නොහැකි තත්ත්වයක හෝ වෙනත් හේතු නිසා එම යුතුකම් ඉටු කිරීමට නුසුදුසු තත්ත්වයක සිටින බව කොමසාරිස්වරයාට ඒත්තු ගියහොත්, එම සාමාජිකයාගේ පත්වීම අවසාන කොට වෙනත් සාමාජිකයකු ඒ කාරක සභාවට පත් කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකි ය :

එසේ වුව ද, ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ අන් ලෙසකින් ධුරය අත්හරින සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු, ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ධුරය අත්හැරියහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස තුළ ධුරය දැරිය යුතු ය.

(8) ගොවිජන සේවා කාරක සභාවක සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු, කාරක සභාවේ රැස්වීම්වල දී මූලාසනය දැරීමට වාර්ෂිකව තෝරා ගත යුතු ය.

(9) ගොවිජන සේවා කාරක සභාවක ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම, බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(10) මේ පනතේ අනිකුත් විධිවිධානවලට යටත් ව, ගණපූරණයක් ඇතිවීමට අවශ්‍ය සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ඇතුළු ව ගොවිජන සේවා කාරක සභාවක කාර්ය පටිපාටිය නිශ්චය කිරීමට සහ විධිමත් කිරීමට බලය කාරක සභාවට තිබිය යුතු ය.

(11) ගොවිජන සේවා කාරක සභා රැස්වීමක් කැඳවීම සහ එහි මූලාසනය ගැනීම යම් වේලාවක දී අවස්ථාවෝචිත යයි හෝ අවශ්‍ය යයි කොමසාරිස්වරයා කල්පනා කරන්නේ නම් ඔහුට එසේ කැඳවීම සහ මූලාසනය ගැනීම කළ හැකි ය.

ලේකම්වරයා.

44. කොමසාරිස්වරයා විසින් ගොවිජන සේවා කාරක සභාවේ සාමාජිකයකු, කාරක සභාවේ ලේකම්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ ලේකම්වරයා එම කාරක සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

කෘෂිකාර්මික ඉඩම් ලේඛනය.

45. (1) සෑම ගොවිජන සේවා කාරක සභාවක් විසින් ම, එම කාරක සභාවේ බල ප්‍රදේශය තුළ ඇති කෘෂිකාර්මික ඉඩම්වල ලේඛනයක් නියමිත ආකාරයට පිළියෙල කිරීම, ප්‍රතිශෝධනය කිරීම සහ පවත්වාගෙන යාම කළ යුතු ය:

එසේ වුව ද, එම එක් එක් කාරක සභා බල ප්‍රදේශය තුළ ඇති කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ පළමුවන ලේඛනය කොමසාරිස්වරයා විසින් පිළියෙල කොට සහතික කළ යුතු ය.

(2) ඒ කෘෂිකාර්මික ඉඩම් ලේඛනයෙහි, එක් එක් කෘෂිකාර්මික ඉඩමේ නම සහ ප්‍රමාණය ද, අවස්ථාවෝචිත පරිදි, ඉඩම් හිමියාගේ, අඳ ගොවියාගේ සහ ඉඩම් හිමි ගොවියාගේ නම සහ කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ද සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන යටතේ පිළියෙල කරන ලද හෝ ප්‍රතිශෝධනය කරන ලද සහ තත්කාලයෙහි වලංගුව පවත්නා ලේඛනයක යම් සටහනක් සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර, එය එහි සඳහන් විස්තර සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියෙහි සඳහන් ලේඛනය පිළියෙල කිරීමෙහි හා ප්‍රතිශෝධනය කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ආ) එවැනි ලේඛනයක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට මේ පනත යටතේ හිමිකම් ඇතැයි කියන්නා වූ ද, තමාගේ නම එසේ ඇතුළත් කර නොමැත්තා වූ ද, යම් තැනැත්තකුට සිය නම එහි ඇතුළත් කරවා ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභාව වෙත ඉල්ලුම් කිරීමට විධිවිධාන සැලැස්වීම;

(ඇ) එවැනි ලේඛනයක තමාගේ නම ඇතුළත් වී ඇත්තා වූ ද වෙනත් යම් තැනැත්තකුගේ නම එහි ඇතුළත් වී තිබීමට විරුද්ධත්වය දක්වන්නා වූ ද යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තාගේ නම, ලේඛනයෙන් මකා හරින ලෙස ගොවිජන සේවා කාරක සභාව වෙත ඉල්ලුම් කිරීමට විධිවිධාන සැලැස්වීම;

(ඈ) ඉල්ලීම් සහ විරුද්ධතාවන් නිශ්චය කිරීමෙහි ලා ගොවිජන සේවා කාරක සභාව විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

(ඉ) යම් කාරක සභාවකට කරන ලද යම් ඉල්ලීමක් හෝ විරෝධතාවක් මත ගොවිජන සේවා කාරක සභාවක් එළැඹුණු තීරණයකට විරුද්ධව කොමසාරිස්වරයාට අභියාචනා කිරීමට විධිවිධාන සැලැස්වීම

සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

ගොවිජන සේවා කාරක සභාවල කාර්යයන් සහ බලතල.

46. (1) සෑම ගොවිජන සේවා කාරක සභාවක් විසින් ම, තමන් ගේ බල සීමා ප්‍රදේශය තුළ, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම සහ රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කළ යුතු අතර, කොමසාරිස්වරයාගේ පාලනයට සහ විධානයට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව,—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට, ඇරීමට, බද්දට ගැනීමට හෝ දීමට හෝ කුළියට දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ;

(ආ) අක්කරයකට එක් වර්ෂයකට රුපියල් හයකට වැඩි නොවන අක්කර බද්දක් සහ මේ පනත යටතේ සලස්වනු ලබන සේවාවන් සඳහා වෙනත් යම් ගාස්තුවක් ද, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන්ගෙන් හෝ භුක්තිකරුවන් වෙත පනවා ඔවුන්ගෙන් ඒවා අය කර ගැනීමට ;

(ඇ) කාරක සභාවේ මුදල්, එහි බලතල පාවිච්චි කිරීමේ දී හා යුතුකම් ඉටු කිරීමේ දී සිදුවන වියදම් පියවීමට සහ නියම කරනු ලැබිය හැකි යම් කාර්යයන් සඳහා පරිහරණය කිරීමට ;

(ඈ) කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාම සහ එය ක්‍රියාත්මක කිරීමට

ගොවිජන සේවා කාරක සභාවකට බලය තිබිය යුතු ය.

(3) ඒ සෑම කාරක සභාවක් ම, එහි බලතල පාවිච්චි කිරීමෙහි දී සහ යුතුකම් ඉටු කිරීමෙහි දී, කොමසාරිස්වරයාගේ හෝ නියම කරනු ලැබිය හැකි බලය පැවරුණු බලධරයකුගේ සාමාන්‍ය විධානවලට යටත් විය යුතු ය.

(4) කොමසාරිස්වරයා විසින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ආකාරයට සහ ක්‍රමයට එම කාරක සභාවේ ගිණුම් පවත්වාගෙන යාම එක් එක් ගොවිජන සේවා කාරක සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. ඒ ගිණුම් විගණකාධිපතිවරයා විසින් වාර්ෂික ව විගණනය කරනු ලැබිය යුතු ය.

අක්කර බද්ද අයකර ගැනීම සඳහා කාර්ය පටිපාටිය.

47. (1) ගොවිජන සේවා කාරක සභාවක් විසින්, එම කාරක සභාවට අක්කර බද්ද ගෙවිය යුතු කෘෂිකාර්මික ඉඩමක සෑම අයිතිකරුවකට හෝ භුක්තිකරුවකුට, ලිඛිතව කරන දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු යම් කාලසීමාව තුළ දී එම බද්ද ගෙවන ලෙස නියෝග කරනු ලැබිය හැකි ය.

(2) ලිඛිත දැන්වීමක් දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා එම දැන්වීමේ සඳහන් මුදල් ප්‍රමාණය, ඒ සඳහා දෙනු ලැබූ කාලය තුළ දී ගෙවීමට අපොහොසත් වූ බවට විධිමත් පරීක්ෂණයකින් පසුව ගොවිජන සේවා කාරක සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, එම කාරක සභාව විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ඒ බද්ද ගෙවිය යුතු ඒ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පිහිටා ඇත්තේ යම් ස්ථානයක ද ඒ ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, ඒ මුදල, එම අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක ආකාරයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, කාරක සභාව විසින්, ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයකුගේ අත්සන යටතේ ඒ සහතිකයේ නම් කරනු ලැබූ තැනැත්තාගෙන් කාරක සභාවට එහි සඳහන් මුදල අය විය යුතු බවට දෙනු ලැබූ සහතිකයක් එම තැනැත්තාගෙන් එම මුදල කාරක සභාවට අය විය යුතු බවට වූ තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

48. මේ පනතින් නැතහොත් මේ පනත යටතේ හෝ මේ පනත යටතේ පනවන ලද යම් නියෝගයකින් යම් ගොවිජන සේවා කාරක සභාවක් වෙත පිරිනමනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කරන ලෙස හෝ යුතුකමක් ඉටු කරන ලෙස හෝ කාර්යයක් කරන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ කාරක සභාවට විධාන කරන ලද පසු, එම විධානයේ සඳහන් කාලසීමාව තුළ එසේ කිරීම කාරක සභාවක් පැහැර හරින අවස්ථාවක දී, ඒ බලය ක්‍රියාත්මක කිරීම, යුතුකම් ඉටු කිරීම හෝ කාර්යය කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකි අතර, කොමසාරිස්වරයා විසින් මේ වගන්තියේ විධිවිධාන යටතේ එසේ කරනු ලබන ක්‍රියාවක් ඒ කාරක සභාව විසින් කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. කොමසාරිස්වරයා සතු බලය.

49. එක් එක් ගොවිජන සේවා කාරක සභාවක් අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය. ගොවිජන සේවා කාරක සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

50. ගොවිජන සේවා කාරක සභාවක සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය. ගොවිජන සේවා කාරක සභාවක නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

51. ගොවිජන සේවා කාරක සභාවේ කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා හෝ එයට හිතකර හෝ ආනුෂංගික කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි මුදලක් හෝ මුදල්, යම් අනුමත ණය දෙන ආයතනයකින් කොමසාරිස්වරයාගේ අනුමතයට යටත්ව ණයට ලබාගැනීම නීත්‍යනුකූල වන්නේ ය. මුදල් ණයට ගැනීමේ බලය.

**සේවකයන් හෝ නියෝජිතයන් පත් කිරීම.**

52. (1) ගොවිජන සේවා කාරක සභාවක බලතල පාවිච්චි කිරීම සහ කාර්ය ඉටුකිරීම පිණිස සුදුසු යයි එම කාරක සභාව සලකන යම් සේවකයන් හෝ නියෝජිතයන් එය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ යම් කෘෂිකාර්මික පලදාවර්ධන කමිටුවක් විසින් පත් කරනු ලැබූ සියලුම සේවකයන් සහ නියෝජිතයන්, මේ පනත යටතේ ඒ වෙනුවට ගොවිජන සේවා කාරක සභාවක් පිහිටුවනු ලැබූ දිනයෙහි සිට ධුරය දැරීම අවසන් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ එවැනි සියලුම සේවකයන්හට සහ නියෝජිතයන්හට, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ගොවිජන සේවා අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ එක් එක් සේවකයාට හෝ නියෝජිතයාට ඔහු ධුරය දැරූවේ යම් කෘෂිකාර්මික පලදාවර්ධන කමිටුවක ද ඒ පලදාවර්ධන කමිටුවට අයත් ඔහු භාරයේ තිබූ සියලු පොත් සහ ලේඛන ආපසු භාරදී ඇත්නම් සහ ගොවිජන සේවා කාරක සභාවක් විසින් ඔහු සේවයේ නියුක්ත කර ගනු ලැබ නොමැති නම්, රුපියල් පන්සියයක් නොඉක්මවන මුදලක් හෝ මාස තුනක වැටුප යන මේ දෙකින් වැඩි මුදල ගෙවනු ලැබිය යුතු ය.

**ගොවිජන සේවා කාරක සභා මුද්දර ගාස්තුවලින් සහ ගාස්තුවලින් නිදහස් වන බව**

53. සෑම ගොවිජන සේවා කාරක සභාවක්ම—

(අ) ඒ ගොවිජන සේවා කාරක සභාව විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි වාසියට හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව මේ වගන්තියෙන් දෙන ලද නිදහස නිසා නොවේ නම් ගෙවීමට ඒ ගොවිජන සේවා කාරක සභාව යටත්වන අවස්ථාවක එකී සාධන පත්‍රය හෝ ලේඛනය සම්බන්ධයෙන් අයවිය යුතු ගාස්තුවෙන් ; සහ

(ආ) ලේඛන ලියාපදිංචි කිරීමට අදාළ තත්කාලයෙහි බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවකින්

නිදහස් වන්නේ ය.

**ආදායම් බද්දෙන් නිදහස් බව.**

54. සෑම ගොවිජන සේවා කාරක සභාවක් ම, එය විසින් ලබා ගන්නා ආදායම හෝ ලාභ විෂයෙහි යම් බද්දක් ගෙවීමෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන යටතේ නිදහස් වන්නේ ය.

## VI වන කොටස

## වගා නිලධරයන්

**වගා නිලධරයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය.**

55. (1) මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි වගා නිලධරයන් යම් ගණනක් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ නිලධරයන් කොමසාරිස්වරයාගේ සාමාන්‍ය පාලනයට සහ විධානයට යටත් විය යුතු ය.

(2) සෑම වගා නිලධරයකු විසින් ම තමාගේ බල ප්‍රදේශය ඇතුළත පහත දැක්වෙන කාර්ය ඉටු කළ යුතු ය :—

(අ) කෘෂිකාර්මික ඉඩම් වර්ෂා ජලයෙන් පෝෂණය වුව ද එසේ නැතහොත් ප්‍රධාන හෝ සුළු වාරිමාර්ගවලින් පෝෂණය වුව ද ඒ සියලු කෘෂිකාර්මික ඉඩම් වගාකිරීම සම්බන්ධ වූ සියලු කටයුතුවල යෙදීම ;

(ආ) සුළු වාරිමාර්ග වැඩවලට හෝ සුළු වාරිමාර්ග වැඩ පවත්වා ගෙන යාමේ වැඩවලට අදාළ සියලු කටයුතුවල යෙදීම සහ වාරිමාර්ග හෝ වගා කිරීමේ අයිතිවාසිකම්වලට හෝ ඊට අදාළ තහවුරු වූ චාරිත්‍රවලට හෝ ඒ සම්බන්ධයෙන් බල පවත්නා රීතියකට පටහැනි වන්නා වූ හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හැකිතාක් දුරට වළක්වා ලීම ; සහ

(ඇ) කෘෂිකාර්මික ඉඩම්වල සහ වාරිමාර්ග වැඩවල, සතුන් අයාලේ යාම සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට කටයුතු කිරීම

කළ යුතු ය.

(3) යම් වගා නිලධරයකුගේ බල ප්‍රදේශය ඇතුළත, යම් තැනැත්තකු විසින්, වාරිමාර්ගවලට හෝ වගා කිරීම්වලට අදාළ යම් තහවුරු වූ චාරිත්‍රයකට හෝ යම් රීතියකට පටහැනි වූ යම් ක්‍රියාවක් කරන ලද හෝ ඒ තැනැත්තාගෙන් යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවක එමගින් එම බල ප්‍රදේශය ඇතුළත වූ කෘෂිකාර්මික ඉඩමක් හිමි ගොවියකුට හෝ බුත්තිකරුවකුට හානියක් සිදුවිය හැකි විටෙක දී, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම, අලාභ සිදුවීම වැළැක්වීමට අප්‍රමාදව ක්‍රියා කළ යුතු වූ තරම් ස්වභාවයේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නම්, වගා නිලධරයා විසින්, අවස්ථානුකූලව, අවශ්‍ය විය හැකි පරිදි යම් පියවර ගැනීම සහ වියදම් දැරීම කළ යුතු අතර යම් පියවරක් ගත්තේ නම් හා වියදමක් දැරුවේ නම් එසේ ගන්නා ලද පියවර සහ දරන ලද වියදම පිළිබඳව වාර්තාවක් වහාම එම ක්‍රියාව හෝ නොකර හැරීම සිදුවූයේ යම් බල ප්‍රදේශයක් ඇතුළත ද, එම බල ප්‍රදේශයේ කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ යුතු ය.

(4) යම් වියදමක් දරන්නට සිදුවූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් වූ විට දරන්නට සිදුවූ මුදල ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයා වෙත ගෙවීමට යටත් විය යුතු අතර, එම තැනැත්තා ගෙවීම පැහැර හැරියහොත් ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන පරීක්ෂණයක දී, ඒ තැනැත්තාට කරුණු කියාපෑමට අවස්ථාවක් දීමෙන් පසුව, ඒ මුදල නිසි පරිදි වියදම් කර ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වීමෙන් පසු, එම වියදම් දරන්නට සිදුවූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ තැනැත්තාගේ නම, එකී මුදල, එම ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ස්වභාවය, වියදම දරන්නට සිදුවූයේ යම් නිලධරයකු විසින් ද, එම නිලධරයාගේ නම සඳහන් කරමින් සහතිකයක් අත්සන් කොට, එම තැනැත්තාට එම සහතිකය භාරදීමට සැලැස්විය යුතු ය.

(5) (4) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ සහතිකයක් භාරදෙනු ලැබූ යම් තැනැත්තකු, සහතිකය ඔහුට භාරදීමෙන් පසු දින දහයක් ඇතුළත ඔහුගෙන් අයවිය යුතු මුදල ගෙවීම පැහැර හරින අවස්ථාවක, එම මුදල අයකර ගත යුතු වූයේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද එම ඉඩම පිහිටා තිබෙන්නේ යම් මහෙස්ත්‍රාත්

අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණයට එම සහතිකයෙහි සඳහන් කරනු ලැබූ තැනැත්තාගෙන් එහි සඳහන් මුදල අයවිය යුතු බවට සහතිකයක් ඉදිරිපත් කරමින් ඒ මුදල අයකර ගැනීමට කොමසාරිස්වරයාට ක්‍රියා කළ හැකි ය. තවද, එම මුදල එම අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක ආකාරයෙන් එම තැනැත්තාගෙන් අයකර ගත යුතු ය.

(6) (5) වන උපවගන්තියේ කාර්ය සඳහා, කොමසාරිස්වරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක්, එහි සඳහන් මුදල් ප්‍රමාණය සහතිකයෙහි සඳහන් කරනු ලැබූ තැනැත්තාගෙන් අයවිය යුතු බවට වූ තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

වාරිමාර්ගවලට අදාළ වූ වැරදි සහ දණ්ඩන.

56. (1) (අ) යම් සුළු වාරිමාර්ග වැඩක් යම් ඔඩයකින් හෝ දිය පාරකින් හෝ සැදුම් ලද්දේ ද ඒ ඔඩය හෝ දිය පාර ඕනෑකමින් ම සහ අනර්ථකාරී ලෙස අවහිර කරන, බාධා කරන හෝ අයුතු ලෙස අල්ලා ගන්නා හෝ යම් ආකාරයකින් අවහිර කිරීමට, බාධා කිරීමට හෝ අයුතු ලෙස අල්ලා ගැනීමට සලස්වන ; හෝ

(ආ) යම් සුළු වාරිමාර්ග වැඩක වේල්ලක්, ඉවුරක් හෝ එහි යම් කොටසක් ඕනෑකමින් ම සහ අනර්ථකාරී ලෙස කපා හරින ; හෝ

(ඇ) යම් සුළු වාරිමාර්ග වැඩකින් සංරක්ෂණය කරනු ලැබූ ජලය නාස්ති කිරීමට ඕනෑකමින් ම හෝ අනර්ථකාරී ලෙස සලස්වන ; හෝ

(ඈ) එම ජලය, තමාගේම ප්‍රයෝජනය සඳහා ඕනෑකමින් ම සහ අයුතු ලෙස ඇද ගන්නා හෝ හරවා ගන්නා

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) කොමසාරිස්වරයා හෝ ඒ වෙනුවෙන් කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට, මේ පනත යටතේ තමා වෙත පවරනු ලැබූ යම් යුතුකමක් නිත්‍යානුකූලව ඉටුකිරීමේ දී නිත්‍යානුකූල හේතුවක් නොමැතිව, විරෝධය පාන හෝ අවහිර කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### පොදු විධිවිධාන

ඉඩම් හිමි ගොවියාගේ හෝ බුත්තිකරුගේ වගා අයිතිවාසිකම් වලට මැදිහත් වීම.

57. (1) කෘෂිකාර්මික ඉඩමක, ඉඩම් හිමි ගොවියකු හෝ බුත්තිකරුවකු විසින් හෝ එම ඉඩම් හිමි ගොවියාගේ හෝ බුත්තිකරුගේ වගා අයිතිවාසිකම්වලට යම් තැනැත්තකු අනවශ්‍ය ලෙස මැදිහත් වන බවට හෝ මැදිහත් වීමට තැත් කරන බවට කොමසාරිස්වරයාට පැමිණිල්ලක් කරනු ලැබූ අවස්ථාවක දී, එම අනවශ්‍ය මැදිහත් වීම හෝ මැදිහත් වීමට තැත් කිරීම, බෝගයට හෝ පශු සම්පතට හානියක් හෝ පාඩුවක් සිදුවන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වුව හොත්, ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියමයෙහි සඳහන් විධාන අනුව ක්‍රියා කරන ලෙස ඉල්ලමින් ඒ තැනැත්තා වෙත නියමයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් නියමයකින්, එම නියමය කරනු ලැබුවේ යම් ඉඩමක්, බෝගයක් හෝ පශු සම්පතක් සම්බන්ධයෙන් ද, ඒ ඉඩම, බෝගය හෝ පශු සම්පත කෙරෙහි, එම තැනැත්තාගේ ඇති අයිතිවාසිකම්වලට හෝ හිමිකම්වලට හෝ සම්බන්ධතාවකට හෝ හානියක් නො වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලවීම තහවුරු කිරීමේ කාර්යය සඳහා, එම නියමය කරනු ලැබුවේ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ද එම ඉඩම පිහිටා ඇති බලප්‍රදේශය තුළ සිටින සාම නිලධරයාගේ ආධාරය කොමසාරිස්වරයාට ලබා ගත හැකි අතර, එම ආධාරය දීම සාම නිලධරයාගේ යුතුකම විය යුතු ය. එසේම, සාම නිලධරයා විසින් එම කාර්ය සඳහා එම නියමයට අනුකූලවීම තහවුරු කිරීමට අවශ්‍ය විය හැකි ප්‍රමාණයේ යම් බලයක් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක්, නිසි අධිකාරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කරනු ලබන තෙක්, එම නියමය කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා කෙරෙහි එම නියමය අනුගම්‍ය වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයකට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

58. මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ යම් වරදක් කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, හය මාසයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය. දණ්ඩන.

59. මේ පනතින් හෝ මේ පනත යටතේ පත්කරනු ලැබූ ගොවිජන සේවා කාරක සභාවක යම් සාමාජිකයකු හෝ එම කාරක සභාවේ යම් සේවකයකු හෝ නියෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ නො පැවරිය යුතු ය. ගොවිජන සේවා කාරක සභාවක සාමාජිකයන්ට විරුද්ධව නඩුවක් පැවරිය නොහැකි බව.

60. (1) ගොවිජන සේවා අරමුදල යනුවෙන් හැඳින්විය යුතු අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ගොවිජන සේවා අරමුදල.

(2) එම අරමුදලට,—

(අ) මේ පනත යටතේ යම් වරදක් සඳහා අධිකරණයක් විසින් පනවනු ලැබූ සියලුම දඩ මුදල් ;

(ආ) මේ නීතිය යටතේ හෝ වෙන යම් නීතියක් යටතේ අරමුදලට ගෙවනු ලැබිය යුතු සියලුම මුදල් ;

(ඇ) මේ අරමුදලට පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ ;

(ඈ) ඒකාබද්ධ අරමුදලින් මේ අරමුදලට ගෙවනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණ ;

(ඉ) අරමුදලට ගෙවනු ලැබීමට, කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ ;

(ඊ) 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන යටතේ අක්කර බද්ද වශයෙන් එකතු කරන ලද සියලුම මුදල් ප්‍රමාණ,

ගෙවිනු ලැබිය යුතු ය.

(3) ඒ අරමුදලෙහි මුදල්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පලදාවර්ධනය දියුණු කිරීම පිණිස හා සංවර්ධනය කිරීම සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම පිණිස පාවිච්චි කරනු ලැබිය හැකි ය. අරමුදලේ පරිපාලනය පිළිබඳව කොමසාරිස්වරයා වගකිව යුතු ය.

(4) අරමුදලේ ගිණුම්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ආකාරයට පවත්වාගෙන යා යුතු අතර, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි විස්තර ඒ ගිණුම්වල ඇතුළත් විය යුතු ය.

(5) එක් එක් මුදල් වර්ෂය සඳහා වූ අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුත්තේ ය.

(6) එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස දොළහේ කාලසීමාව අරමුදලේ මුදල් වර්ෂය විය යුතු ය.

කෘෂිකාර්මික ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

61. ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින්, එම නිවේදනයෙහි සඳහන් කෘෂිකාර්මික ඉඩම මේ පනතේ යම් කාර්යයක් සඳහා අත්කර ගැනීම අවශ්‍ය යයි අමාත්‍යවරයා සහතික කළ විට, එම ඉඩම, ඉඩම් අත්කර ගැනීමේ පනත අදාළ කර ගැනීමේ කාර්යය සඳහා මහජන කාර්යයකට අවශ්‍ය වූවක් ලෙස සලකනු ලැබිය යුතු අතර එය ඒ පනත යටතේ අත් කර ගනු ලැබිය හැකි ය :

එසේ වුවද, ඒ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මේ පනත යටතේ ඒ ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල නියමිත ආකාරයට ගණන් බලනු ලැබූ එම ඉඩමේ වාර්ෂික බද්දෙහි වටිනාකම ගුණ කිරීමෙන් ලැබෙන ගුණිතයට සමාන විය යුතු ය.

කුඹුරක් කවර කාර්ය සඳහා යෙදිය හැකි ද යන වග.

62. (1) කොමසාරිස්වරයා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි කොන්දේසි යටතේ ඔහු විසින් දෙනු ලබන ලිඛිත අවසරයක් නොමැති ව, (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව වූ වගා කිරීමක් නොවන වෙන යම් කාර්යයක් සඳහා කිසිම තැනැත්තකු විසින් කුඹුරු ප්‍රමාණයක් නොයෙදිය යුතු ය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක—

(අ) වී; හෝ

(ආ) වී ගොවිතැන් කරන කන්න අතර තුර, යම් කාලයක වී හැර සෙසු ආහාර බෝග හෝ සත්වාහාර බෝග; හෝ

(ඇ) කුඹුරු ප්‍රමාණයේ ගොවියා විසින්, ඒ සඳහා ඉදිරිපත් කළ ලිඛිත ඉල්ලීමක් පිට, කොමසාරිස්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි නිකුත් කරන ලද අවසර පත්‍රයකින් ඒ ප්‍රමාණයෙහි වගා කිරීමට බලය දී ඇති වෙන යම් බෝග යක් වෙතොත්, ඒ බෝගය

වගා කළ හැකි ය.

(3) (2) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදවල විධිවිධාන යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් වගා කරනු ලැබූ අවස්ථාවක දී, ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු බද්ද නිශ්චිත කරනු ලැබිය හැකි බද්ද විය යුතු අතර 21 වන වගන්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(4) යම් කුඹුරු ප්‍රමාණයක්—

(අ) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කොට, යම් තැනැත්තකු විසින් යොදනු ලැබුව හොත්, හෝ

(ආ) (2) වන උපවගන්තියෙහි විධිවිධාන අනුව නොව, අන් ලෙසකින් ඒ කුඹුරු ප්‍රමාණය ගොවියා විසින් වගා කරනු ලැබුව හොත්

අවස්ථාවෝචිත විය හැකි පරිදි, ඒ තැනැත්තා නැතහොත් ඒ ගොවියා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය ගෙවීම පැහැර හැරිය හොත්, මාසයකට නොවැඩි කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය. තවද, වරදකරු කරනු ලැබීමෙන් පසුව ද ඒ තැනැත්තා හෝ ඒ ගොවියා එම වරද කරගෙන යන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, වරදකරු කරනු ලැබීමෙන් පසුව එසේ කළ එක් එක් දිනයක් සඳහා රුපියල් පණහක දඩයකට ඔහු යටත් විය යුත්තේ ය.

(5) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී වරදට විෂය වූ ක්‍රියාව කිරීමට කොමසාරිස්වරයාගේ අවසරය තමා ලැබ සිටි බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා මත වන්නේ ය.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත යටතේ සමාලෝචන මණ්ඩලය ඉදිරියේ විභාග කිරීමට ඇති අභියාචන විභාග කිරීම.**

63. (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ 53 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාලෝචන මණ්ඩලය ඉදිරියේ විභාග කිරීමට අභියාචනයක් ඇති අවස්ථාවක, එම අභියාචනය, එම කාර්යය සඳහා විශේෂයෙන් පත් කරනු ලැබූ නිලධරයකු විසින් විභාග කොට අවසාන කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයකු මරණය සිදුවීමේ, ඉල්ලා අස්වීමේ, ධුරයෙන් ඉවත් කිරීමේ, මෙරටින් බැහැරව සිටීමේ හෝ අසනීපවීමේ හේතුව නිසා තම ධුරයෙන් ඉවත් වුවහොත්, ඔහුගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා ඔහු වෙනුවෙන් අනුප්‍රාප්ත වීමට තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරනු ලැබූ නිලධරයකු, ඔහු ධුරය හිස් කරන්නේ නම් මිස, අවුරුදු දෙකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය :

එසේ වුව ද,—

(අ) (2) වන උපවගන්තිය යටතේ මියගිය, ඉල්ලා අස්වූ හෝ ඉවත් කරනු ලැබූ යම් නිලධරයකු වෙනුවෙන් පත් කරනු ලැබූ නිලධරයකු, අවසන් වරට සඳහන් කළ නිලධරයාගේ ධුරකාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය ; තව ද,

(ආ) මෙරටින් බැහැරව සිටින හෝ අසනීපවී සිටින නිලධරයකු වෙනුවෙන් වැඩ බැලීමට පත් කරනු ලැබූ නිලධරයකු, අවසන් වරට සඳහන් කළ තැනැත්තා බැහැරව සිටින හෝ අසනීපව සිටින කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) නියමිත කාලය අවසන් වීම නිසා ධුරය දැරීම අවසන් කරන නිලධරයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

(5) එසේ පත් කරනු ලැබූ සෑම නිලධරයකු ම, ඔහු විසින් විභාග කරනු ලැබූ සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම, ඒ අභියාචනයට අදාළ වන්නා වූ සියලු නඩු කටයුතු පිළිබඳ වාර්තාවක් තබා ගත යුතු ය.

(6) නිලධරයකු විසින් යම් සාක්ෂිකරුවකු දිවුරුම් පිට විභාග කරනු ලැබිය හැකි අතර, සුදුසු යයි ඔහු අදහස් කරන්නේ නම් ඔහු ඉදිරියේ පෙනී සිටීමට හෝ ඔහුගේ මතය අනුව අදාළ යයි සලකන ලේඛනයක් ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකු කැඳවනු ලැබිය හැකි ය.

(7) සිතාසි නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා,—

(අ) සිතාසියෙහි සඳහන් කරනු ලැබූ වේලාවේ දී සහ ස්ථානයේ දී එම නිලධරයා ඉදිරියේ පෙනී සිටීම සාධාරණ හේතු නොමැතිව පැහැර හැරියහොත් ; හෝ

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව දිවුරුම් දීම ප්‍රතික්ෂේප කළ හොත් හෝ යථා පරිදි දිවුරුම් දීමෙන් පසුව, ඒ නිලධරයා විසින් ඔහුගෙන් අසනු ලැබූ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැති ව ප්‍රතික්ෂේප කළහොත් හෝ එසේ කිරීම පැහැර හැරිය හොත් හෝ එවැනි යම් ප්‍රශ්නයකට ඹිතාකමින්ම අසත්‍ය පිළිතුරක් දුනහොත් ; හෝ

(ඇ) තමා සන්තකයෙහි තිබෙන්නා වූ සහ ඉදිරිපත් කිරීමට ඔහුට නියම කර ඇති යම් ලේඛනයක්, එම නිලධරයා වෙත ඉදිරිපත් කිරීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කළහොත් හෝ එසේ කිරීම පැහැර හැරියහොත්

මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(8) අභියාචනයක් කරනු ලැබුවේ යම් තීරණයක් හෝ තීන්දුවක් වෙනුවෙන් ද, ඒ තීරණය හෝ තීන්දුව මේ වගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචනයක් මත නිලධරයකුට ස්ථිර කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැකි අතර, එම අභියාචනය සම්බන්ධයෙන් ඒ නිලධරයාගේ තීන්දුව අවසානාත්මක වන්නේ ය.

64. මේ පනත යටතේ යම් වරදක් සඳහා වූ යම් නඩු පැවැරීම කදී, අපරාධ නඩු විධාන සම්බන්ධයෙන් තත් කාලයේ බල පවත්නා නීතිය යටතේ නඩු පැවැරීමට බලය ලත් තැනැත්තන්ට අමතරව, කොමසාරිස්වරයාට හෝ ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට, ඒ නඩුව පවත්වාගෙන යාමට හිමිකම් තිබිය යුතු ය. නඩු පැවරීමට බලය දෙනු ලැබූ තැනැත්තන්.

65. මේ පනත යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් ආරාවුලක් විභාග කිරීමේ හෝ තීන්දු කිරීමේ කාර්යය සඳහා,— කොමසාරිස්වරයාට දිසා අධිකරණයක බලය තිබිය යුතු බව.

(අ) සාක්ෂිකරුවකු කැඳවීම හෝ එසේ පැමිණ සිටීමට බලකිරීමට,

(ආ) ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීමට, සහ

(ඇ) සාක්ෂිකරුවන්ට දිවුරවීමට හෝ ප්‍රතිඥා කරවීමට දිසා අධිකරණයක සියලු බලතල කොමසාරිස්වරයාට තිබිය යුතු ය.

66. (1) නියම කරනු ලැබීමට මේ පනතේ සඳහන් හෝ නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් හා නියෝග සාදනු ලැබීමට මේ පනතින් නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ, නියෝගයෙහි නිශ්චිතව සඳහන් කළ හැකි පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන සෑම නියෝගයක් ම ඒ අනනුමත

යේ දින සිට, එහෙත් එය යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම් හා අන් හැරීම්.

67. (1) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනත, සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත් ඉවත් කරනු ලැබුව ද—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනතේ 44 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ කෘෂිකාර්මික පලදාවර්ධන අරමුදලේ බැරට ඇති සියලුම මුදල් ද ආහාර නිෂ්පාදන (වතු) පනතේ 14 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ ආහාර නිෂ්පාදන අරමුදලේ බැරට ඇති සියලුම මුදල් ද මේ පනත යටතේ පිහිටුවනු ලබන ගොවිජන සේවා අරමුදලට පවරනු ලැබිය යුතු ය;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ කෘෂිකාර්මික පලදාවර්ධන කමිටුවල හා ජාතික රාජ්‍ය සභාවේ, 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත යටතේ පිහිටුවනු ලැබූ ගොවි කාරක සභාවල වත්කම් හා බැඳීම්, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ගොවිජන සේවා කාරක සභාවට මාරු කළ යුතු ය;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ, 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ සියලු ම කෘෂිකාර්මික පලදාවර්ධන කමිටු, මේ පනත යටතේ ගොවිජන සේවා කාරක සභා සංස්ථාපනය කරනු ලබන තෙක් තවදුරටත් ක්‍රියාකාරී වන්නේ ය;

(ඈ) මේ පනත ආරම්භ වීමට කලින් වූ දිනයක කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් ඉදිරියේ, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ විධිවිධාන යටතේ ගොවිජන සේවා කොමසාරිස්වරයා ඉදිරියේ කටයුතු අවසන් කිරීමට තිබූ, 1958 අංක 1 දරන කුඹුරු පනතේ 14 වන වගන්තිය යටතේ ගොවිජන සේවා කොමසාරිස්වරයා ඉදිරියේ පැවැති සියලුම නඩු කටයුතු ශූන්‍ය හා බල රහිත විය යුතු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) කාලසීමා ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, 1958 අංක 1 දරන කුඹුරු පනතේ 4 වන වගන්තියේ (7අ) වන උපවගන්තිය යටතේ හා ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ 3 (9) වන

වගන්තිය යටතේ අද ගොවීන්ට උපචිත වූ අලාභ සඳහා වූ සියලුම ඉල්ලීම්, මේ පනතේ විධිවිධාන යටතේ ඒ අද ගොවියන්ට උපචිත වූ ඉල්ලීම් හැටියට සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ සලසා ඇති ආකාරයට අය කර ගනු ලැබිය යුතු ය;

(ඊ) මේ පනත ආරම්භ වන දිනයට පෙර දිනයක, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනතේ සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ විධිවිධාන යටතේ කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් ඉදිරියේ කටයුතු අවසන් කිරීමට තිබූ සියලු නඩු කටයුතු, මේ පනතේ විධිවිධාන යටතේ කොමසාරිස්වරයා ඉදිරියේ පවත්වනු ලැබූ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර. ඒ අනුව මේ පනතේ විධිවිධාන යටතේ එම කොමසාරිස්වරයා ඉදිරියේ පවත්වා ගෙන ගොස් අවසන් කළ යුතු ය;

(උ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ විධිවිධාන යටතේ කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් ඉදිරියේ ආරම්භ කර අවසන් කර තිබූ සියලුම නඩු කටයුතු සම්බන්ධයෙන් ඉහත කී පනත්වල විධිවිධාන යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කර නොමැති වූ ද. නැතහොත් අභියාචනය කර තිබුණ ද, නිෂ්ප්‍රභ කරනු ලැබුවා වූ ද, එම නඩු කටයුතු වල දී කරන ලද ආඥා බලාත්මක කිරීම සඳහා පියවරවල් ඉහත කී පනත්වල විධිවිධාන යටතේ මහේස්ත්‍රාත් අධිකරණ විසින් ගෙන නොමැත්තා වූ අවස්ථාවක එම නඩු කටයුතු මේ පනතේ විධිවිධාන යටතේ වූ නඩු කටයුත ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ අනුරූප විධිවිධාන අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය;

(ඌ) 1958 අංක 1 දරන කුඹුරු පනතේ 21 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ විභාග කිරීමට තිබූ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත ආරම්භ වීමේ දිනයට පෙර දිනයක පවරනු ලැබූ කවර හෝ හේතුවක් උඩ අස්කර ගන්නා ලද හෝ සියලු නඩු කටයුතු එකී පනත හෝ ජාතික රාජ්‍ය සභාවේ පනත පරිච්ඡින්න කිරීම නිසා කිසියම් හානි කර ආකාරයකින් බලපාන අන්දමින්, නතර කරගනු ලැබූ ලෙස හෝ අත්හිටවූ ලෙස සලකනු නොලැබිය යුතු ය. ඒ සියලු නඩු කටයුතු මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ තවදුරටත් පවත්වා ගෙන ගොස් අවසාන කළ යුත්තේ ය;

(එ) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව වූ දිනයක ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදාවර්ධන පනතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ හෝ විධිවිධාන යටතේ යම් අධිකරණයක පවත්නා සියලු නඩු කටයුතු මේ පනතේ විධිවිධාන යටතේ විභාග කර අවසාන කළ යුත්තේ ය;

(ඒ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත යටතේ සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත යටතේ සාදනු ලැබූ හා මේ පනත ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දින යේ දී බලපැවැත් වූ සෑම නියෝගයක් ම මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින්, ඒ අනුව සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

68. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අස් කිරීම" යන්නෙන්, අඳ ගොවියකු සම්බන්ධයෙන් වූ විට, අඳ ගොවියාට බදු දී ඇති කුඹුරු ප්‍රමාණයෙහි යම් කොටසක් හෝ එය සම්පූර්ණයෙන් ම හෝ ඔහු විසින්. පාවිච්චි කිරීමේ, බුත්ති විඳීමේ හා වගා කිරීමේ අයිතිය නියම හෝ අනියම් ක්‍රමවලින් ඔහුට අහිමි කිරීම අදහස් වේ;

"ඉඩම් හිමි ගොවියා" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධ යෙන් වූ විට එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම වගා කරන්නා වූ එහි අයිතිකරුවකු හෝ එහි පොලීමරා උගස් හිමියා අදහස් වන අතර, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පවරා දෙන ලද කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් නම්, ඒ ආඥාපනතෙන් හෝ එය යටතේ ඒ කුඹුරු ප්‍රමාණ යට හිමිකම් ලබන්නා වූ ද, සම්පූර්ණ කුඹුරු ප්‍රමාණයේ ගොවියා වූ ද තැනැත්තා ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියා ලෙස සැලකිය යුතු ය;

"ඉඩම් හිමියා" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ විට එම ඉඩම යම් තැනැත්තකුට බදු දෙන ලද නම්, එම බදු මුදලට එවකට හිමිකම් කියන ඉඩම් හිමි ගොවියා නොවන තැනැත්තා එයින් අදහස් වන අතර, එම කුඹුරු ප්‍රමාණය යම් අතුරු අඳ ගොවියකුට බදු දෙන අඳ ගොවියා ද ඊට ඇතුළත් වේ;

"ඉදිකිරීම" යන්නෙන් යම් වාරිමාර්ග වැඩක් සම්බන්ධයෙන් වූ විට, යම් වාරිමාර්ග වැඩක් වැඩි දියුණු කිරීම හෝ ව්‍යාප්ත කිරීම, හෝ යම් අත්හැර දමන ලද වාරිමාර්ග වැඩක් අළුත් වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ (මෙහි මතුවට අඩංගු "පවත්වාගෙන යාම" යන්නේ අර්ථකථන යට යටත් ව) යම් වාරිමාර්ග වැඩක හෝ ඒ යටතේ ජලය සැපයෙන ප්‍රදේශයක හෝ එම වැඩෙහි හෝ ප්‍රදේශයෙන් යම් කොටසක හෝ ආරක්ෂාව සඳහා වූ යම් ක්‍රියා මාර්ගයක් ඇතුළත් වේ;

"කුඹුර" යන්නෙන් වී ගොවිතැන් කරන හෝ වී ගොවිතැන් සඳහා පිළියෙළ කළ හෝ මීට කලින් කවර දිනක හෝ වී ගොවි තැන් කරන ලදුව, වී ගොවිතැන සඳහා සුදුසු වන ඉඩමක් අදහස් වේ. ගොවියා විසින් කමත වශයෙන් හෝ පදිංචියට ගෙයක් ඉදි කර ගැනීම සඳහා හෝ යොදා ගන්නා, එම

ඉඩමට යාබද හෝ ඊට සම්බන්ධ අනෙකුත් ඉඩම් ද ඊට ඇතුළත් වේ. එහෙත්, මෙහි හෝ මේ පනතේ විධිවිධාන අනුව වූ වගා කිරීමක් නොවන යම් කාර්යයක් සඳහා කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව, යොදනු ලබන යම් ඉඩමක් ඊට ඇතුළත් නොවේ;

"කෘෂිකර්මය" යන්නට—

(i) වී, කෙත් බෝග, කුළු බඩු, කාර්මික බෝග, එළවළු, පලතුරු, මල්, තණබිම් හා සත්වාහාර වගා කිරීම;

(ii) කිරි පට්ටි පාලනය, සතුන් ඇති කිරීම සහ බෝ කිරීම; සහ

(iii) ශාක හා ඵල තවාන්

ඇතුළත් වේ;

"කෘෂිකාර්මික ඉඩම" යන්නෙන්, මේ පනතේ අර්ථානුකූලව කෘෂිකර්මය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගත හැකි ඉඩම් අදහස් වන අතර, පෞද්ගලික ඉඩම් හා ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් ප්‍රඥප්තියක් යටතේ අන්සතු කරනු ලැබූ ඉඩම් ඊට ඇතුළත් වේ;

"කෘෂිකාර්මික කටයුතු" යන්නෙන් කෘෂිකර්මය ඇතුළත් වන යම් කටයුත්තක් අදහස් වන අතර, ඒ කටයුත්තෙහි සහ සුළු වාරිමාර්ග සම්බන්ධ යම් කටයුත්තක යොදවනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පාවිච්චිය ඊට ඇතුළත් වේ;

"ගොවියා" යන්නෙන්, යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ විට ගොවිජන සේවා කාරක සභාවක් හැර, තමන් විසින් ම හෝ තම පවුලේ සාමාජිකයකු විසින් හෝ වෙන යම් තැනැත්තකු සමග හවුලේ හෝ ඒ කුඹුරු ප්‍රමාණයේ වී ගොවිතැන් කරන එක් එක් කන්නය තුළ—

(අ) සී සෑම, වැපිරීම, ගොයම් කැපීම යන ක්‍රියාවලින් දෙකක් හෝ වැඩි ගණනක්; හා

(ආ) වගාව රැකීමේ හෝ බලා ගැනීමේ ක්‍රියාව කරන තැනැත්තෙක්

අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනතින් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයකින් නියම කරන ලදැයි අදහස් වේ;

"නියමිත බැංකුව" යන්නෙන්, නියම කරනු ලැබිය හැකි කවර හෝ බැංකුවක් අදහස් වේ;

"ණය" යන්නෙන්, යම් ණයක්, අත්තිකාරමක් හෝ අයිරාවක් අදහස් වන අතර, එහි පොළියත් ඊට ඇතුළත් වේ;

"පවත්වාගෙන යාම" යන්නෙන්, යම් වාරිමාර්ග වැඩක් සම්බන්ධයෙන් වූ විට, පවත්නා යම් වාරිමාර්ග වැඩක් හෝ ඒ යටතේ ජලය සැපයෙන යම් ප්‍රදේශයක් ආරක්ෂා කිරීම සඳහා වූ යම් ක්‍රියාකාරකමක් අදහස් වේ;

" පවුලේ සාමාජිකයා " යන්න යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදුනු විට එම තැනැත්තාගේ භාර්යාව හෝ ස්වාමි පුරුෂයා, පුත්‍රයෙක් හෝ දියණියක් ඉන් අදහස් වන අතර, එවැනි භාර්යාවක හෝ ස්වාමි පුරුෂයකු, පුත්‍රයකු හෝ දියණියක නොමැති විට ඒ තැනැත්තාගේ මව හෝ පියා, සහෝදරයෙක් හෝ සහෝදරියක් ඉන් අදහස් වේ. එහෙත් එසේ අදහස් වීමට නම් අදාළ තැනැත්තාගේ ප්‍රධාන රැකියාව ගොවිතැන විය යුතු අතර ඔහුගේ එකම ආදායම් මාර්ගය ඒ කුඹුරු ප්‍රමාණයෙන් සැලසී තිබිය යුතු ය ;

" බදුදීම " යන්න, යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ විට, යම් සේවයක් ඉටු කිරීම හෝ මුදලින් නැතහොත් එම කුඹුරු ප්‍රමාණයේ අස්වැන්නෙන් පංගුවකින් සමන්විත බද්දක් ගෙවීම සලකා වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ එම කුඹුරු ප්‍රමාණය බුක්ති විඳීමට සහ වැඩ කිරීමට යම් තැනැත්තකුට අවසර දීම එයින් අදහස් වේ ;

" බුක්තිකරු " යන්නෙන්, තමා බදුකරු හෝ පොලීමරු උකස් හිමිවීමේ හේතුවෙන් කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගැනීමට හා බුක්ති විඳීමට තත් කාලයේ හිමිකම් ඇති තැනැත්තා අදහස් වන අතර, ඉඩම් සංවර්ධන ආඥාපනත සහ රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් පනතක් යටතේ අන්සතු කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගන්නා වූ හා බුක්ති විඳින්නා වූ තැනැත්තන් ඇතුළත් විය යුතු අතර මේ පනතේ අර්ථානුකූලව අඳ ගොවියෙක් ද ඊට ඇතුළත් වේ ;

" වාරිමාර්ග වැඩ " යන්නට—

(අ) වාරිමාර්ග වැඩක සංයුක්ත වූ හෝ එයට ආනුෂංගික වූ හෝ උපකාරක වූ යම් වැවක්, වේල්ලක්, අමුණක්, ඇළක්, ඕඩයක්, දිය බෙදුමක්, කුඹුරු ඕඩයක් හෝ දිය පාරක් ;

(ආ) වාරිමාර්ග වැඩක් ඉදි කිරීමකට හෝ පවත්වාගෙන යාමකට සංයුක්ත වූ හෝ එයට ආනුෂංගික වූ හෝ උපකාරක වූ යම් ව්‍යුහයක්, මාර්ගයක්, පාලමක්, සොරොව්වක්, දොරටුවක් හෝ වෙනත් ඉංජිනේරු වැඩක් ;

(ඇ) යම් වගා කරනු ලැබූ ප්‍රදේශයකින් ජලය ඉවත් කිරීම හෝ එම ප්‍රදේශය තුළට හෝ ඉන් පිටතට ලවණ ජලය ගලා යාම වැලැක්වීමේ හෝ පාලනය කිරීමේ හෝ එම ප්‍රදේශය ජල ගැල්මෙන් ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා වූ යම් ව්‍යුහයක්, වේල්ලක්, සොරොව්වක් හෝ වෙනත් ඉංජිනේරු වැඩක්

ඇතුළත් වේ ;

"ග්‍රාම නිලධරයා" යන්නට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ දී ඇති අර්ථයම ඇත්තේ ය;

"සුළු වාරිමාර්ග වැඩ" යන්නෙන් කෘෂිකාර්මික ඉඩම් අක්කර දෙසියයක් දක්වා ජලය සැපයෙන වාරිමාර්ග වැඩක් අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හා සම්බන්ධ ව තත්කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයෙක් අදහස් වේ.